වැඩිදුර වාර්තාවක් මගින් ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කරමින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රුපියල් 91,635,591.03 ක මූල්‍යමය පාඩුවක් සිදු කිරීමට අදාලව අත් අඩංගුවට ගන්නා ලද සැකකරුවන් දෙදෙනා ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීම. 1

H 027655 – 10.000 (2006/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

පොලිස් / பொலிஸ் ] 53

(P2 Orig. & Dup. S. & T.) 05/80

ශ්‍රී ලංකා පොලීසිය / இலங்கைப் பொலிஸ்

**මහේස්ත්‍රාත්වරයා වෙත සපයන තොරතුරු**

**நீதிவானுக்கு வழங்கப்படும் தகவல்**

| | | | |
|---|---|---|---|
| තො. පො. පිටුව / த. ர. பக்கம் | FCID/ 29/2016. | | |
| තො. පො. ඡේදය / த. ர. பந்தி | | අධිකරණය / நீதிமன்றம் | කොටුව මහේස්ත්‍රාත් අධිකරණය |
| ස්ථාන අංකය : අ. වැ. ලේ. / நிலைய இல. : குற்றம் சாட்டத்தக்க குற்றப் பதிவேடு | | නඩුවේ අංකය / வழக்கு இல. | B/ 3088 /2016 |
| අ. නො. වෙ. වැ. ලේ. / குற்றமேற்றத்தகாத குற்றங்களின் பதிவேடு | | | |

**1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XI වැනි පරිච්ඡේදයේ**

**115 (1), (2), (3), (4), 120 (1), (2), (3) වැනි වගන්ති යටතේ**

**වරදක් විමර්ශනය කිරීමේ වාර්තාව**

தண்டனைக் குற்றங்கள் புலனாய்வு பற்றி தேசிய அரசுப் பேரவையினது 1979 ஆம் ஆண்டின் 15 ஆம் இலக்க குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவைச் சட்டத்தின் 115 (1), (2), (3), (4), 120 (1), (2), (3) ஆகிய பிரிவுகளின் கீழான அறிக்கை

කොටුව ගරු

**මහේස්ත්‍රාත්වරයා වෙතය,**

**நீதிவானுக்கு.** ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවේ වියදමින් මෝටර් වාහන කුලියට ගෙන ඉන්ධන සහ රියදුරන් යොදවා පරිභාහිර කාර්යයන් වල යෙදීමෙන් රුපියල් මිලියන 41 කට ආසන්න මුදලක පාඩුවක් කර ඇති ........ බවට

කොළඹ 02 නො. 102, ඩබ්.ඒ.ඩී. රාමනායක මාවතේ ........ පදිංචි

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති මයිකල් එමිල් ජොයකිම් ........ විසින්

20 15.09.21 ........ වැනි දින කරන ලද පැමිණිල්ල විභාග කළ බව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ ඒකක 07 හි ස්ථානාධිපති ප්‍ර.පො.ප. අනුර ප්‍රේමරත්න ........ වන මම මෙයින් වාර්තා කරමි.

........ என்றுயிடப்பட்டதைச் சேர்ந்த

........ ஆகிய நான்

20........ ஆம் ஆண்டு ........ மாதம் ........ திகதியன்று ........

என்றுயிடப்பட்டதைச் சேர்ந்த ........ என்பவர் செய்த ........

........

........ என்ற பொலன்பதும் முறைப்பாட்டினைப் பற்றி விசாரித்துள்ளேன் என இத்தால் அறிக்கையிடுகின்றேன்.

| | |
|---|---|
| පරීක්ෂණයේදී නිශ්චය කොට දැනගත් කරුණු සහ පැමිණිල්ල සනාථ කරන තවත් සාක්ෂි කරුවන් සිටිනවා නම්, ඔවුන්ගේ සාක්ෂි<br>விசாரணையில் கண்டறியப்பட்ட நிகழ்வுகளும் முறைப்பாட்டுக்கு ஆதாரமாக மேலதிக சாட்சிகளின் சான்றுகள் ஏதேனும் இருப்பின் அதுவும் | (කරුණාකර අනෙක්පිට බලනු මැනවි)<br>........<br>........ |
| චූදිතයාගේ සාක්ෂිකරුවන්ගේ නම හා ලිපිනය සහ ඔවුන්ගේ සාක්ෂි සංක්ෂේපයක්.<br>குற்றஞ்சாட்டப்பட்டவரினது சாட்சிகளின் பெயரும் முகவரியும் அதுக்காக அவர்களது சாட்சியமும். | ........<br>........ |
| චූදිතයා අධිකරණයට යවන ලද්දේ සිරභාරයේ ද නැතහොත් ඇප මත ද යන වග, ඇප මත නම්, ඇප සිටිනු ඇතිනියම මුදල<br>குற்றஞ்சாட்டப்பட்டவர் கட்டுக்காவலிலோ அல்லது பிணையிலோ விடப்பட்டுள்ளார் என்பது. பிணையிலாயின் பிணைமுறியை இணைக்கப்பட வேண்டும். | ........<br>........ |
| ඉදිරිපත් කෙරෙන දේපල තිබේනම් අධිකරණය වෙත යවා ඇත්නම් ඒ පිළිබඳ ලැයිස්තුව<br>நீதிமன்றத்துக்கனுப்பப்பட்ட சான்றுப் பொருள்கள், ஏதேனுமிருப்பின் அவற்றின் நிரல் | ........<br>........ |

2016.09.13 වන දින මාගේ මුල් වී වාර්තාව හා සැබැදේ.

මෙම පැමිණිල්ලට අදාලව මා විසින් නිලධාරීන් යොදවා මෙම සිද්ධියට අදාලව වැඩිදුරටත් විමර්ශන කටයුතු සිදුකල අතර, සිදුකල විමර්ශන තුලින් අනාවරණය වූ කරුණු සම්බන්ධයෙන් ප්‍රගතිය පහත පරිදි ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරමි.

2014 වර්ෂයේදී සිදු කරන ලද විගණන වාර්තාව අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් කුලී පදනම මත ලබා ගත් වාහන 40 ක් වැඩබිම් වල පාවිච්චියට නොගෙන වෙනත් කාර්යයන් වල යෙදවීම සම්බන්ධයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ හිටපු සභාපති මයිකල් එමිල් ජෝයකිම් යන අය දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලද පැමිණිල්ලක් මෙම කොට්ඨාශය වෙත යොමුකිරීමෙන් අනතුරුව ආරම්භ කරන ලද විමර්ශනයකි.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ප්‍රසාන් කුරුවිට යන අයගේ අංක ප්‍ර.අ.වි.19/39, 41/100/2015/SI-04 විගණන වාර්තාවට අනුව අංක KR-7730, KQ-7961, JO-5953, KT-2884, GQ-4894, GJ-4501, KQ-9762, PE-3626, PC-6171, KU-9867, JE-6557, KB-0638, PD-2563, KD-4049, HN-4098, GI-0001, GN-5767, PC-2896, KC-2431, GO- 9528, KL-0812, PC-9097, KK-8941, KI-4648, JR-5353, GY-4635, KH-0883, 301-6830, KO- 5871, JL-8058, HA-0800, KO-1375, CAB-9727, 250-4713, GF-0787, 54-5678, KM-0882, LJ-7909, 252-1933, PF-3072, වාහන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත කුලී පදනම මත ලබා ගැනීම පැහැදිලි ක්‍රියාදාමයක් නොවන බවත් එම වාහන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ කාර්යයන් වලට යොදා ගෙන නොමැති බවත් වාහන සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් වාහන කුලිය, ඉන්ධන වියදම් හා රියදුරු වැටුප් අතිකාල හා යැපීම් දීමනා වශයෙන් ගෙවන ලද මුදල් ආසන්න වශයෙන් රුපියල් මිලියන 41,073,937.33 ක් වන බවත් සඳහන් කර ඇත.

දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයෙන් සිදු කරන ලද මූලික විමර්ශන වාර්තාවට අනුව මෙම වාහන වලට අමතරව අංක KA-8125, KR-7730, KE-0231, KS-7735, GR-5774, KT-9085, KI-1610, KS-0097,KT-9085, KI-1610, 250-4713, HC-2048, HI-2658, KA-8125, J Z 2669" HF-6920, KT-6089, PF-6970 වාහන සඳහාද වාර්තා ලබා ගැනීමට මෝටර් රථ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර මෙම පැමිණිල්ල සඳහා යා කර ඇත. මෙම පැමිණිල්ලට 2016.09.16 දින කොටුව ගරු මහේස්ත්‍රාත් උසාවි නඩු අංක බී/3088/16 යටතේ කරුණු වාර්තා කර විමර්ශන කටයුතු ආරම්භ කර ඇත. පැමිණිල්ලේ සඳහන් වාහන පාවිච්චි කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයේදී පහත තොරතුරු අනාවරණය විය.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ප්‍රසාන් කුරුවිට මහතා කැඳවා පැමිණිල්ලේ සඳහන් කරුණු වලට අදාලව ප්‍රකාශයක් ලබා ගනිමින් විමර්ශනය සිදුකල අතර, එහිදී අනාවරණය වූයේ 2014 වර්ෂයට අදාලව පමණක් ඔහු විසින් විගණනයක් සිදුකොට විගණන වාර්තාවක් සංස්ථාවේ සභාපති වරයා වෙත යොමුකර ඇති බවයි. එමෙන්ම එම විගණන තුලින් ප්‍රසම්පාදන ක්‍රියාදාමයෙන් පරිබාහිරව කුලී පදනම මත සංස්ථාවට වාහන ලබාගෙන ඇති බවත්, වාහන කුලී පදනම මත පවරා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථා වැඩ බිම වෙත ලබා දීමක් සිදු නොකර ඇති බවත් විමර්ශනයේදී අනාවරණය විය. ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවේ මෝටර් වාහන කුලියට ගෙන සංස්ථාවේ රියදුරන් යොදවා සංස්ථාවේ කාර්යයන් වලින් පරිබාහිර කාර්යයන් සඳහා යොදා ගැනීම මගින් රුපියල් මිලියන 41 කට ආසන්න මුදලක් පාඩු සිදු වී ඇති බවට එම වාර්තාව මගින් දක්වා ඇත.

මුල් පැමිණිල්ල සමග ගොනුගතව ඉදිරිපත්ව තිබූ විගණන වාර්තාවේ එක් එක් වාහනයට අදාලව විමර්ශනය සිදු කරමින් එම වාහන 40 ට අදාලව විශ්ලේෂණය සිදු කරමින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රවාහන අංශය වෙතින් 2010 වර්ෂයේ සිට 2015.01.08 දින දක්වා කුලී පදනම මත පවරා ගනු ලැබූ සියළුම වාහන වලට අදාලව විස්තර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කල අතර, ඊට අදාලව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සහකාර ප්‍රවාහන කළමණාකරුගේ ප්‍රකාශයක් සටහන් කර ඇත.

එලෙස ලබාගත් සහකාර ප්‍රවාහන කළමණාකරුගේ ප්‍රකාශය තුලින් අනාවරණය වූයේ 2010 වර්ෂයේ සිට 2015.01.08 දක්වා කුලී පදනම මත පවරාගත් වාහන අතරින් පුද්ගලයන් 38 දෙනෙකුගේ පාවිච්චිය සඳහා ලබාදී ඇති බවත්, එම අය අමාත්‍ය වරයාගේ නිල නොවන කාර්ය මණ්ඩලයට අයත් බවත් නිල නොවන කාර්යය මණ්ඩලයේ පුද්ගලයන් 02 ක් පාවිච්චි කල වාහන සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ඉන්ධන ලබා දීමට ක්‍රියාකර ඇති බවත්ය.

මෙලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් කුලී පදනම මත වාහන පවරා ගැනීමේ රාජකාරී වගකීම ඇත්තේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන වෙතය. ඊට අදාල සහයක කටයුතු සහකාර ප්‍රවාහන කළමණාකරු වෙත පැවරී ඇත. මූලික වශයෙන් මෙම වාහන කුලී පදනම මත ලබා ගැනීමේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සහකාර ප්‍රවාහන කලමනාකාර ඉලන්දාරි දේව දයානන්ද යන අයගේ ප්‍රකාශය අනුව 2010,2011 වර්ෂ වල ප්‍රසම්පාදන කොමිටියේ අනුමත මිල ගණන් සම්බන්ධ ලේඛනය අනුව ප්‍රසම්පාදන ක්‍රියා

දාමයෙන් පරිබාහිරව කුලී පදනම මත වාහන පවරා ගැනීමේ උපරිම මිල මාසික කුලිය රුපියල් 38,000/- ක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගෙන ඇත.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රසම්පාදන ක්‍රියාදාමය සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීමේදී අනාවරණය වූයේ මිලියන 05 දක්වා ප්‍රසම්පාදන බලය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්ගේ විෂය පථයට වැටෙන බවයි. මිලියන 05 ත් 15 ත් අතර ප්‍රසම්පාදන බලය සාමාන්‍යාධිකාරී වරුන් වෙතද මිලියන 15 ත් 50 ත් අතර බලය සභාපති වෙතද ඊට වඩා වැඩිවන විටද අමාත්‍යංශ ලේකම් වෙතද යොමුවී ඇති බවයි. මෙලෙස බලය බෙදා දෙමින් වාර්ෂිකව අමාත්‍යංශ ලේකම් විසින් ලිපියක් මගින් බලය පැවරීමක් සිදුවී ඇති බවටද අනාවරණය විය. ඒ අනුව මෙලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාහන කුලී පදනම මත ලබා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පිරිස් හා පාලන වෙතට පැවරී තිබී ඇති බවටද එම කාල වකවානුව තුල සමන්ත ලොකුහැන්නදිගේ මහතා 2011.05.23 වන දින සිට වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන ලෙස පත්වීමක් ලබා පසුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන වශයෙන් පත්වී ඇති බවත්, ඊට පෙර මෙම තනතුරේ රංජිත් එදිරිසිංහ කටයුතු කර ඇති බවත් විමර්ශන තුලින් අනාවරණය විය.

තවද මෙලෙස වාහන කුලී පදනමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ලබා ගැනීමේ ක්‍රියාවලියේදී 2009 වර්ෂයේදී ප්‍රසම්පාදන කමිටුව විසින් ලබා ගන්නා ලද තීරණයකට අනුව රියදුරු සහ ඉන්ධන සංස්ථාව වෙතින් සැපයීමේ පදනම මත ඉහත වාහන ලබාගෙන ඇති බවට අනාවරණය විය. එමෙන්ම මෙම තීරණයට අනුව 2009.04.01 දින සිට ඉදිරියට ක්‍රියාත්මක වී ඇති බවටද අනාවරණය වූ අතර, ඒ අනුව එන්ජින් ධාරිතාවය 1400-600 CC අතර වන මෝටර් කාර් රථ සඳහා රුපියල් 38,000/- ක උපරිමයකටද, එන්ජින් ධාරිතාවය 1400 CC අඩු අසියාතික රටවල නිෂ්පාදිත කාර් රථ සඳහා රුපියල් 35,000/- ක උපරිමයකට යටත්වද ධාරිතාවය 2000-3000 CC අතර වූ ඉදිරි වායු සමීකරණ සහිත වෑන් රථ සඳහා රුපියල් 38,000/- ක උපරිමයකටද, වායු සමීකරණ රහිත වෑන් රථ සඳහා රුපියල් 30,000/- ක උපරිමයකට යටත්වද ද්විත්ව වාහන වායු සමීකරණ වෑන් රථ සඳහා රුපියල් 45,000/- ක උපරිමයක්ද ධාරිතාවය 2500- 3000 CC සිංගල් ඩබල් කැබ් රථ සඳහා රුපියල් 38,000/- ක්ද ඩබල් කැබ් රථ සඳහා රුපියල් 55,000/- උපරිමයක්ද වන ලෙස කුලී පදනම මත වාහන ලබාගත යුතු බවට අනාවරණය විය. මෙම තීරණය මත පදනම් වී 2014 දෙසැම්බර් මස දක්වා වාහන කුලී පදනම මත ලබාගෙන ඇති බවටද විමර්ශන තුලින් අනාවරණය විය.

මෙම පැමිණිල්ලට අදාලව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත කුලී පදනම මත 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලබා ගන්නා ලද වාහන භාවිතයට ගැනීම සම්බන්ධව තොරතුරු සොයා ගැනීමට වාහන කුලී පදනම මත ලබාගත් ලේඛණ පරීක්ෂා කිරීමේදී අනාවරණය වූයේ වැඩබිම් වල සාමාන්‍යාධිකාරී වරුන් සිදුකල ලිඛිත ඉල්ලීම් වලට අනුව එම වැඩබිම් සඳහා වාහන ලබාදී ඇති බවයි.

ඒ අනුව ගොනුගත වී ඇති වාහන ඉල්ලීම් සිදුකල වැඩබිම් වල සාමාන්‍යාධිකාරී වරුන් වන 1. හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී යන්ත්‍රෝපකරණ වීරතුංග ආරච්චි ප්‍රදීප් කපිල නිශාන්ත, 2. හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ඉදිකිරීම් අමරසිංහ ආරච්චිලාගේ පියදස 3. හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ගාල්ල මාතලේ රත්නපුර දිස්ත්‍රික්ක වල මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘති භාර උදයවංශ රාළහාමි හෙට්ටිආරච්චි යන අය කැඳවා ඔවුන්ගේ ප්‍රකාශ ලබා ගැනීම තුලින් අනාවරණය වූයේ ඔවුන් විසින් එවැනි ඉල්ලීමක් සිදු කලද වැඩබිම් වෙත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් යොමු කරන ලද වාහන නොලැබුණු බවයි. මෙහිදී අනාවරණය වූයේ කුලී පදනම මත ලබා ගන්නා ලද වාහන ව්‍යාපෘති වල යොදවන බවට අඟවා මෙම වාහන අමාත්‍ය වරයා වෙත ලබාදී ඇති බවයි.

තවද අදාල වැඩබිම් වල ප්‍රධානී වැඩබිම වෙත වාහන අවශ්‍ය බවට කරන ලද ඉල්ලීම් ලිපි වලට සඳහන් දිනයන්ට මාස කීපයකට පෙර වාහන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත කුලී පදනම මත ලබාගෙන ඇති බවට කරුණු අනාවරණය විය.

ඉහත ක්‍රියාදාමයට අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් කුලී පදනම මත ලබාගන්නා ලද වාහන අතරින් වාහන 37 ක් අමාත්‍ය කාර්යාලය වෙත ලබාදී ඇති බවටත් පරිභාහිර වාහන 03 ක් සඳහා ඉන්ධන ලබාදීම් සිදුකර ඇති බවටත් විමර්ශන තුලින් අනාවරණය විය. එලෙස අනාවරණය වූ වාහන පාවිච්චි කල පුද්ගලයන්ට අදාලව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් වාහන කුලිය හා ඉන්ධන ලබා දීමට අදාලව ගෙවා ඇති බවත් මේ බව සහකාර ප්‍රවාහන කළමණාකරු අයි.බී. දයානන්ද මහතාගේ ප්‍රකාශය තුලින් සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් මාධව හර්ෂක සේනාවිර මහතාගේ ප්‍රකාශ තුලින් අනාවරණය විය.

| අනු අංකය | වාහන අංකය | පාවිච්චි කල අය | පාවිච්චි කල කාලය | වැය කල මුදල (රුපියල්) |
|---|---|---|---|---|
| 1. | ගිවිසුමේ සඳහන් KA 8125 හා අනෙකුත් වාහන | ආර්.එම්.බී. අබේසිංහ | 2011 සැප්තැම්බර් සිට 2014 සැප්තැම්බර් දක්වා | 2,756,433.74 |

| | | | | |
|---|---|---|---|---|
| 2. | PB 6970 | ඒ.ඩී. මාරසිංහ | 2010 සැප්තැම්බර් සිට 2014 ඔක්තෝම්බර් දක්වා | 321,441.06 |
| 3. | ගිවිසුමේ සඳහන් KT 9085 හා අනෙකුත් වාහන | එස්. තිලකරත්න | 2011 පෙබරවාරි සිට 2011 නොවැම්බර් දක්වා | 3,616,467.88 |
| 4. | ගිවිසුමේ සඳහන් KB 4421, JC 2440 හා අනෙකුත් වාහන | ජේ.එච්.ආර්. ජයානන්ද | 2012 ජනවාරි සිට 2014 සැප්තැම්බර් දක්වා | 3,736,298.73 |
| 5. | ගිවිසුමේ සඳහන් HK 8877, KT 2884 හා අනෙකුත් වාහන | එල්. කුමාරත්න | 2011 අප්‍රේල් මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා | 2,778,897.75 |
| 6. | ගිවිසුමේ සඳහන් GP 4894 වාහනය | ආර්.ඩබ්.කේ. විරවංශ | 2011 ඔක්තෝම්බර් 2014 ඔක්තෝම්බර් දක්වා | 3,123,583.10 |
| 7. | ගිවිසුමේ සඳහන් KA 9447 හා අනෙකුත් වාහන | ඒ.එන්.එස්. මෙන්ඩිස් | 2011 ඔක්තෝම්බර් මස සිට 2014 ඔක්තෝම්බර් දක්වා | 2,535,086.50 |
| 8. | ගිවිසුමේ සඳහන් 252-9408, PC 8430, KD 1494, PF 3700 හා අනෙකුත් වාහන | එස්.එච්. කුමාර | 2012 ඔක්තෝම්බර් මස සිට 2014 නොවැම්බර් මස දක්වා | 6,941,307.03 |
| 9. | ගිවිසුමේ සඳහන් 300-2590, 301-2751 හා අනෙකුත් වාහන | ඒ.එච්.එස්. ඉන්දික | 2011 ඔක්තෝම්බර් මස සිට 2014 සැප්තැම්බර් මස දක්වා | 2,302,836.19 |
| 10. | ගිවිසුමේ සඳහන් JO 5953, JE 6557 හා අනෙකුත් වාහන | ඩී.යූ.පී. පෙරේරා | 2013 පෙබරවාරි මස සිට 2014 සැප්තැම්බර් මස දක්වා | 2,680,748.75 |
| 11. | ගිවිසුමේ සඳහන් JI 7117, HO 6515, JS 9725 හා අනෙකුත් වාහන | ඉත්තෑකන්දේ සද්ධාතිස්ස හිමි | 2011 මාර්තු මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා | 2,952,630.00 |
| 12. | ගිවිසුමේ සඳහන් GK 5073, KD 4049, KP 4802 හා අනෙකුත් වාහන | එල්.පී. කුමාර | 2011 ඔක්තෝම්බර් මස සිට 2014 සැප්තැම්බර් මස දක්වා | 3,193,848.42 |
| 13. | ගිවිසුමේ සඳහන් HR 7619 හා අනෙකුත් වාහන | පී.එස්. විජේසිරි | 2013 මාර්තු මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා | 2,427,222.33 |
| 14. | ගිවිසුමේ සඳහන් GI 0001 වාහනය | වාහන | 2014 ජූනි මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා | 398,281.80 |
| 15. | ගිවිසුමේ සඳහන් KK 3081 හා අනෙකුත් වාහන | පී. විජේනායක | 2013 මැයි මස සිට 2014 ඔක්තෝම්බර් දක්වා | 2,212,074.31 |
| 16. | ගිවිසුමේ සඳහන් PC 2896, PC 9097 වාහන | ඩී.ටී. ගමගේ | 2012 නොවැම්බර් මස සිට 2014 නොවැම්බර් | 4,098,031.10 |
| 17. | ගිවිසුමේ සඳහන් KL 0812 වාහනය | ඩබ්. පෙරේරා | 2013 ජූනි මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා | 2,023,211.56 |
| 18. | ගිවිසුමේ සඳහන් KK 8941 වාහනය | පී.එස්. තෙන්නකෝන් | 2012 ජනවාරි මස සිට 2014 සැප්තැම්බර් | 2,197,254.00 |
| 19. | ගිවිසුමේ සඳහන් GR 5774, KA 7440 හා අනෙකුත් වාහන | ඩී.ඩී.ජී. අශෝක කුමාර | 2012 පෙබරවාරි මස සිට 2014 නොවැම්බර් මස දක්වා | 1,994,152.30 |
| 20. | ගිවිසුමේ සඳහන් GY 4635 වාහනය | පී.පී. ආනන්ද ප්‍රියදර්ශන | 2014 මාර්තු මස සිට 2014 ඔක්තෝම්බර් දක්වා | 592,161.27 |
| 21. | ගිවිසුමේ සඳහන් JR 5353 හා අනෙකුත් වාහන | ජී.එන්. පෙරේරා | 2013 දෙසැම්බර් මස සිට 2014 නොවැම්බර් මස දක්වා | 971,169.10 |
| 22. | ගිවිසුමේ සඳහන් 301-6830 වාහනය | ඩබ්.එන්.පී. බණ්ඩාර | 2013 නොවැම්බර් මස සිට 2014 නොවැම්බර් මස දක්වා | 634,650.24 |
| 23. | ගිවිසුමේ සඳහන් JY 0359 හා අනෙකුත් වාහන | ඩබ්.කේ. ප්‍රසාද් මංජු | 2011 පෙබරවාරි මස සිට 2014 නොවැම්බර් | 1,746,000.00 |
| 24. | ගිවිසුමේ සඳහන් GF 0787 වාහනය | නිශ්ශංක | 2013 නොවැම්බර් 2014 අගෝස්තු මස දක්වා | 646,000.00 |
| 25. | ගිවිසුමේ සඳහන් 65-5231, HA 0800, KJ 2376 හා අනෙකුත් වාහන | ඩී.එම්.ජේ.ටී. මෙන්ඩිස් | 2011 ජූනි මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා | 2,298,173.47 |

[redacted]

| | | | | |
|---|---|---|---|---|
| 26. | ගිවිසුමේ සඳහන් HC 2048, HI 2658 වාහන | ජී.ශූ. ජයතිලක | 2011 පෙබරවාරි මස සිට 2013 අගෝස්තු මස දක්වා | 3,097,753.60 |
| 27. | ගිවිසුමේ සඳහන් KA 8125, 32-9390 වාහන | එන්. ඉන්දික | 2010 සැප්තැම්බර් මස සිට 2012 සැප්තැම්බර් මස දක්වා | 2,468,941.73 |
| 28. | ගිවිසුමේ සඳහන් JZ 2669 වාහනය | ආර්. එදිරිසිංහ | 2011 ජනවාරි මස සිට 2013 සැප්තැම්බර් මස දක්වා | 2,217,403.48 |
| 29. | ගිවිසුමේ සඳහන් HF 6920 වාහනය | කේ.එල්.එම්. සමරතුංග | 2011 පෙබරවාරි මස සිට 2014 නොවැම්බර් මස දක්වා | 3,400,750.82 |
| 30. | ගිවිසුමේ සඳහන් KT 6089 වාහනය | විරාජ් සංජීව | 2012 මැයි මස සිට 2013 ඔක්තෝම්බර් මස දක්වා | 1,313,817.07 |
| 31. | ගිවිසුමේ සඳහන් 54-5678 වාහනය | එල්.සී. කුමාර | 2013 ජූලි මස සිට 2014 නොවැම්බර් මස දක්වා | 1,175,379.20 |
| 32. | ගිවිසුමේ සඳහන් KM 0882 වාහනය | ඩී.ඩී.ආර්. ජයවර්ධන | 2013 ජූලි මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා | 1,289,769.94 |
| 33. | ගිවිසුමේ සඳහන් KO 5871 වාහනය | කේ.ඩී.ශූ. ජයසේන | 2013 මාර්තු මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා | 825,872.84 |
| 34. | ගිවිසුමේ සඳහන් JL 8058 වාහනය | නිලානි වීරවංශ | කාලය සම්බන්ධව මෙතෙක් අනාවරණය වී නැත. | 219,547.80 |
| 35. | ගිවිසුමේ සඳහන් 252-1933 වාහනය | එස්. ප්‍රියදර්ශන | 2011 මාර්තු මස සිට 2014 නොවැම්බර් මස දක්වා | 4,340,995.24 |
| 36. | ගිවිසුමේ සඳහන් LJ 7909 වාහනය | ජී.එච්. කුලතුංග | 2012 මැයි මස සිට 2014 සැප්තැම්බර් | 4,782,000.00 |
| 37. | ගිවිසුමේ සඳහන් KB 0638, KA 7440, KC 2431 හා අනෙකුත් වාහන | ඩබ්.එච්.කේ.පී. විජේසේකර | 2014 මාර්තු මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා | 1,858,728.84 |
| 38. | ගිවිසුමේ සඳහන් GJ 4501 හා අනෙකුත් වාහන | ආර්.පී. වික්‍රමසිංහ | 2012 ඔක්තෝම්බර් මස සිට 2014 නොවැම්බර් මස දක්වා | 3,706,236.68 |
| 39. | PF 3072 | එස්. හේරත් | කාලය සම්බන්ධව මෙතෙක් අනාවරණය වී නැත. | 189,353.21 |
| 40. | GX 6926, KI 7553, KJ 7867, KO 1375, PA 7281 | පී. විතාරණ | කාලය සම්බන්ධව මෙතෙක් අනාවරණය වී නැත. | 1,465,894.62 |

ඉහත අනාවරණය වූ කරුණු ඔස්සේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හරහා කුලී පදනම මත පවරාගත් වාහන සංස්ථාවෙන් පරිබාහිර කාර්යයන් සඳහා යෙදවීම සම්බන්ධයෙන් පවතින නීත්‍යානුකූල භාවය සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන ලදී. මෙහිදී අනාවරණය වූයේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව තුල අවශ්‍යතා සඳහා ලබා ගන්නා ලද වාහන පරිබාහිර කාර්යයන් සඳහා යොදවා ගැනීම නීත්‍යානුකූල නොවන බවයි. එය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සාමාන්‍යාධිකාරී ඩැනියෙල් ගනගරාජා සහ හිටපු සාමාන්‍යාධිකාරී එම්.ඩී. පද්මසිරි යන අයගේ ප්‍රකාශ තුලින්ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අභ්‍යන්තර විගණන නිලධාරී ප්‍රනාන් කුරුවිට, සහකාර ප්‍රවාහන කළමණාකරු අයි.ඩී. දයානන්ද යන අයගේ ප්‍රකාශ තුලින්ද අමාත්‍යංශ ලේකම් වරුන් වශයෙන් කටයුතු කල ගෝඨාභය ජයරත්න, විමලසිරි පෙරේරා, නිශ්ශංක එන්. විජේරත්න යන අයගේ ප්‍රකාශ තුලින්ද තහවුරු විය. තවද ඉහතින් සඳහන් කල අමාත්‍යංශ ලේකම් වරුන් පවසා ඇත්තේ එලෙස වාහන ලබාදීම සඳහා නීත්‍යානුකූල දැනුම් දීමක් ඔවුන් විසින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත සිදුකර නොමැති බවයි.

මෙම විමර්ශනය තුලින් අනාවරණය වූයේ එවැනි ලිඛිත ඉල්ලීමක් අමාත්‍ය වරයා විසින් හෝ පෞද්ගලික ලේකම් වරුන් විසින් ඔවුන් වෙත ඉදිරිපත් වී නොමැති බවයි. අමාත්‍යංශ ලේකම් වරුන්ගේ මැදිහත් වීමකින් තොරව මෙම වාහන ලබා ගැනීම අමාත්‍ය වරයා මූලික වී අමාත්‍ය කාර්ය මණ්ඩලය විසින් සිදුකර ඇති බවයි.

ඒ අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත කුලී පදනම මත පවරාගත් වාහන එම සංස්ථාවේ වැඩබිම් වෙත ලබාදී ඇති බවට කරුණු [illegible] දැක්වීමේ අරමුණින් වැඩබිම් භාරව කටයුතු කරන ප්‍රධානීන්ගේ වාහන ඉල්ලීම් ලිපි වාහන පවරා ගැනීමේ ගිවිසුම වෙත පසුව ගොනුගත කර ඇති බවට හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී යන්ත්‍රෝපකරණ ඩබ්.ජී.පී. කපිල නිශාන්තගේ ප්‍රකාශය තුලින්ද, හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ඉදිකිරීම් අමරසිංහ ආරච්චිලාගේ පියදාසගේ ප්‍රකාශය තුලින්ද, ප්‍රධාන ආරක්ෂක නිලධාරී ඉහාසිගේ සංජීව සේනක ද සිල්වා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘති භාර උදයවංශ රාළහාමි හෙට්ටිආරච්චි යන අයගේ ප්‍රකාශ තුලින්ද කරුණු අනාවරණය විය. මෙම ඉල්ලීම් ලිපි වාහන පවරා ගැනීමේ ගිවිසුම් වෙත යොමු කිරීම සඳහා මූලිකව කටයුතු කර ඇත්තේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන වශයෙන් එම තනතුරේ කටයුතු කල සමන්ත ලොකුහැන්නදිගේ මහතා බවට කරුණු අනාවරණය විය.

... වාහන 37 අමාත්‍ය [illegible]
ඉහත පරිදි අමාත්‍ය කාර්යාලය වෙත ලබාදී තිබූ වාහන 37 ... මෙහිදී අනාවරණය වූයේ අමාත්‍ය කාර්‍ය
කර තිබුණේද යන්න සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන ලදී. මෙහිදී අනාවරණය වූයේ අමාත්‍ය කාර්‍ය
කර තිබුණේද යන්න සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන ලදී. හිමිකමක් නොදක්වන ලලිත් පුෂ්පකුමාර
මණ්ඩලය තුල කටයුතු කල වාහනයක් පාවිච්චි කිරීමට නිල වශයෙන් හිමිකමක් නොදක්වන ලලිත් පුෂ්පකුමාර
කළමණාකරණ සහකාරුවෙකු වශයෙන්ද, 2010 වර්ෂය තුල පාවිච්චි කර ඇති බවත්, 2012, 2013, 2014
වර්ෂයයන් තුල අමාත්‍ය කාර්‍ය මණ්ඩලයේ වාහනයක් පාවිච්චි කිරීමට නිල වශයෙන් හිමිකමක් නොමැති
ලලිත් පුෂ්පකුමාර, ඒ.එන්.එස්. මෙන්ඩිස් වාහන පාවිච්චි කර ඇති බවට විමර්ශන තුලින් අනාවරණය විය.
2012, 2013 හා 2014 වර්ෂයන්ට අදාලව ඔහුගේ කාර්‍ය මණ්ඩලය තුල නිලධාරීන් 18 දෙනෙකු බැගින් සිට
ඇති අතර, එම අය අතුරින් ලලිත් පුෂ්පකුමාර හා ඒ.එන්.එස්. මෙන්ඩිස් වාහන අදාල තනතුරට වාහන
හිමිකම් නොදරන පුද්ගලයින් වශයෙන් අදාල වර්ෂයන් තුල වාහන පාවිච්චි කර ඇති බවත් අනාවරණය
විය. එමෙන්ම ඔහුගේ පෞද්ගලික කාර්‍ය මණ්ඩලය වශයෙන් වාහන පාවිච්චි කිරීමට නීත්‍යානුකූල අයිතියක්
තිබූ ප්‍රදීප් විජේසේකර සහ ප්‍රසාද් මංජු යන දෙදෙනා නිල වාහනය වශයෙන් රජයේ වාහනයක් පාවිච්චි
නොකර අදාල ඉන්ධන දීමනාව හා කුලී දීමනාව අමාත්‍යාංශය වෙතින් ලබා ගනිමින් සිටියදී රාජ්‍ය ඉංජිනේරු
සංස්ථාවේ වාහන 02 ක් වංක චේතනාවෙන් පාවිච්චි කර ඇති බවත් අනාවරණය විය.

ඒ අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් අමාත්‍ය කාර්‍ය මණ්ඩලය වෙත ලබාගත් වාහන අතරින් ඉතිරි වාහන කවර කටයුත්තක් සඳහා යොදවා ගැනීමක් සිදුකර තිබේද යන්න සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන ලදී. මෙහිදී අනාවරණය වූයේ මෙලෙස ලබාදී ඇති වාහන අතරින් ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය වරයා විසින් ඔහුගේ ලගම ඥාතීන් වෙතද, පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයින් වෙතද, අමාත්‍ය වරයාගේ ස්ථිර කාර්‍ය මණ්ඩලයේ නිලධාරීන් නොවන පරිබාහිරව බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහාද පාවිච්චි කිරීම සඳහා ලබාදී ඇති බවයි. මෙලෙස ලබාදී ඇති බවට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රවාහන කළමණාකරු අයි.ඩී. දයානන්ද මහතාගේ ප්‍රකාශය තුලින් පැහැදිලි ලෙස අනාවරණය වී ඇත. එම ප්‍රකාශය මෙම වාහන සඳහා අනුයුක්ත කර තිබූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුයුක්ත රියදුරන්ගේ ප්‍රකාශ තුලින්ද එම වාහන සඳහා ඉන්ධන ලබා ගැනීමට පමණක් යොදවා සිටි රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ රියදුරන්ගේ ප්‍රකාශ තුලින්ද අනාවරණය විය.

මෙලෙස ලබාදී ඇති වාහන අතරින් ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ හිටපු අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ ලගම ඥාතීන් වෙතට ලබාදී ඇති බවට අනාවරණය වූ වාහන සහ එම වාහන පාවිච්චි කරන ලද පුද්ගලයින්ගේ විස්තර පහත පරිදි වේ.

(1) විමල් වීරවංශ මහතාගේ අක්කා වන සුමනාවතී වීරවංශගේ බාල පුතා වන රිද්ම විමුක්ති වීරවංශ සඳහා අංක GO 4894 දරණ වාහනයද,

(2) විමල් වීරවංශ මහතාගේ අක්කා වන සුමනාවතී වීරවංශගේ වැඩිමහල් පුතා වන ලලිත් පුෂ්පකුමාර යන අය සඳහා අංක GK 5073, KD 4049, KB 7053, KW 6956, GK 5073, KP 4802 දරණ වාහන වරින් වරද, අමාත්‍ය තුමාගේ

(3) විමල් වීරවංශ මහතාගේ බිරිඳගේ අක්කා වන තනුජා නිශාන්තිගේ ස්වාමි පුරුෂයා වන බෝම්බුවල දිසාවගේ ආනන්ද අශෝක කුමාර යන අය සඳහා අංක KB 6038, HQ 4964, GR 5774, KI 4648, KA 7440 දරණ වාහන වරින් වරද,

(4) විමල් වීරවංශ මහතාගේ බාල සහෝදරිය වන නිලානි වීරවංශගේ ස්වාමි පුරුෂයා වන පල්ලෙපේරු ගමගේ ආනන්ද ප්‍රියදර්ශන යන අයට අංක GY 4635 දරණ වාහනයද

(5) විමල් වීරවංශ මහතාගේ බාල සහෝදරිය වන නිලානි වීරවංශ යන අයට JN 8058 යන වාහනයද පාවිච්චියට ලබාදී ඇති බව අනාවරණය විය.

මෙලෙස වාහන පාවිච්චි කර ඇති රිද්ම විමුක්ති වීරවංශ යන අය ඕෂන් වීව් ආයතනයේ ව්‍යාපෘති නිලධාරියෙකු වශයෙන්ද ලලිත් පුෂ්පකුමාර ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ කළමණාකරණ සහකාර වරයෙකු වශයෙන්ද ඩී.ඩී. ආනන්ද අශෝක ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන අධිකාරී ආරක්ෂක වශයෙන්ද, පී.ජී. ආනන්ද ප්‍රියදර්ශන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ කළමණාකරණ සහකාර වරයෙකු වශයෙන් සහ ගබඩා පාලක වරයෙකු වශයෙන්ද කටයුතු කර ඇති බවක් අනාවරණය විය. තවද ඉහත පුද්ගලයින් 04 දෙනා වාහන පාවිච්චි කල හැකි නිලයක් නොදරමින් මෙලෙස වාහන පාවිච්චි කර ඇති බවට අනාවරණය විය. මීට අමතරව මෙලෙස වාහන පාවිච්චි කර ඇති නිලානි වීරවංශ යන අය කිසිදු රාජ්‍ය ආයතනයක තනතුරක් නොදරා වාහන පාවිච්චි කර ඇති බවටද අනාවරණය විය.

මෙලෙස ලබාදී ඇති වාහන අතරින් ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ හිටපු අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ පක්ෂ ක්‍රියාකාරීන් වන පියසිරි විජේනායක, ලාල් කුලරත්න, කේ.ඩී.යූ. ජයසේන, ඩබ්.බී.ජී. ජයවර්ධන, එල්.සී. කුමාර, විරාජ් සංජීව, නුවන් ඉන්දික, පී.ජී. විජේසිරි, චානක, නිශ්ශංක වෙතට ලබාදී ඇති බවට අනාවරණය වූ වාහන සහ එම වාහන පාවිච්චි කරන ලද පුද්ගලයින්ගේ විස්තර පහත පරිදි වේ.

(1) ලාල් කුලරත්න HK 8877, KT 2884 දරණ වාහන 02 එකක් හැර එකක් වශයෙන් මාරුවෙන් මාරුවටද,

(2) පියසිරි විජේනායක JN 5767, KK 3081, 64-3225, HA 2189, KA 4685 දරණ වාහන එකක් හැර එකක් මාරුවෙන් මාරුවටද,

(3) කේ.ඩී.යූ. ජයසේන KO 5871 දරණ වාහනයද,

(4) ඩී.ඩී.ජී. ජයවර්ධන KM 0882 දරණ වාහනයද,

(5) එල්.සී. කුමාර 54-5678 දරණ වාහනයද,

(6) විරාජ් සංජීව KT 6089 දරණ වාහනයද,

(7) නුවන් ඉන්දික KA 8125, 32-9390 දරණ වාහන එකක් හැර එකක් මාරුවෙන් මාරුවටද,

(8) පී.එස්. විජේසිරි හෙවත් දම්පාල HR 7619, HN 4098 දරණ වාහන එකක් හැර එකක් මාරුවෙන් මාරුවටද,

(9) චානක යන අය අංක GI 0001 දරණ වාහනයද,

(10) නිශ්ශංක යන අය GF 0787 දරණ වාහනයද පාවිච්චි කර ඇති බවත් අනාවරණය විය.

ඉහතින් සඳහන් කල ජාතික නිදහස් පෙරමුණේ සාමාජිකයන් අතරින් ලාල් කුලරත්න මහතා බස්නාහිර පළාත් සභාවේ ජාතික නිදහස් පෙරමුණ නියෝජනය කරන මන්ත්‍රී වරයෙකු වශයෙන්ද, පියසිරි විජේනායක මහතා ජාතික නිදහස් පෙරමුණේ පාර්ලිමේන්තුව නියෝජනය කල මන්ත්‍රී වරයෙකු වශයෙන්ද, එල්.සී. කුමාර මහතා සීතාවක ප්‍රාදේශීය සභාව ජාතික නිදහස් පෙරමුණ නියෝජනය කල මන්ත්‍රී වරයෙකු වශයෙන්ද, පී.එස්. විජේසිරි මහතා ජනතා විමුක්ති පෙරමුණේ සිට ජාතික නිදහස් පෙරමුණ වෙත සම්බන්ධ වූ පක්ෂ සාමාජිකයෙකු වශයෙන්ද ඔහුගේ බිරිඳ වන ප්‍රියංගා මැණිකේ කොතලාවල ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කල ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරියක වශයෙන්ද, නුවන් ඉන්දික පෙරේරා කඩුවෙල ආසනයේ හිටපු සම්බන්ධීකරණ නිලධාරියෙකු වශයෙන්ද ක්‍රියාකාරීව දේශපාලන කටයුතු කර ඇති බවටත් අනාවරණය විය.

මෙලෙස ලබාදී ඇති වාහන අතරින් ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ හිටපු අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙතට ලබාදී ඇති බවට අනාවරණය වූ වාහන සහ එම වාහන පාවිච්චි කරන ලද පුද්ගලයින්ගේ විස්තර පහත පරිදි වේ.

(1) ඉංජිනේරු සංස්ථාවේ සේවයේ නියුතු මහජන සම්බන්ධතා හා වෘත්තීය සමිති ලේකම් ජී.එන්.එස්. මෙන්ඩිස් මහතා KQ 0976, KA 9447, KP 3768, KD 0158, KQ 9762 දරණ වාහන මාරුවෙන් මාරුවටද

(2) යූ.ඩී. ප්‍රියජීව පෙරේරා අමාත්‍ය වරයාගේ මාධ්‍ය ලේකම් වරයෙකු වශයෙන් කාලයක් කටයුතු කර පසුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ උපදේශක වරයෙකු වශයෙන් පත්වීමක් ලබා JO 5953, JE 6557 දරණ වාහන මාරුවෙන් මාරුවටද

(3) ඇමති ආරක්ෂක අංශයට අනුයුක්ත ප්‍රධාන පොලිස් පරීක්ෂක සිසිල හේරත් මහතා අමාත්‍ය වරයාගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරී වශයෙන් කටයුතු කරමින් PC 6171, 252-4908, PC 8430, PF 1277, EA 0260, PE 3626, KD 1494, EA 0004, PF 3770 දරණ වාහන මාරුවෙන් මාරුවටද

(4) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කළමණාකරණ සහකාර වරයෙකු වශයෙන් කටයුතු කල බී.එම්.ජේ.ටී. මෙන්ඩිස් මහතා අමාත්‍ය කාර්යාලයේ වතු නිවාස අංශයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරමින් 65-5231, KI 3053, HR 0800, KG 2376 දරණ වාහන මාරුවෙන් මාරුවටද

(5) අමාත්‍යාංශය තුල රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සම්බන්ධීකරණ ලේකම් වරයෙකු වශයෙන් කටයුතු කල ජේ.එච්.ආර්. නයනානන්ද මහතා KB 4427, JC 2440, KB 8657, JO 5953, CAB 9727 දරණ වාහන මාරුවෙන් මාරුවටද

(6) අලගිය හේවගේ සුරේෂ් ඉන්දික මහතා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සංවර්ධන සහකාර වරයෙක් වශයෙන් කටයුතු කරමින් අමාත්‍යාංශය වෙත සම්බන්ධ වී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් සිට 301-2751, HC 2349, JW 3549, KU 9867, 300-2590 දරණ වාහන මාරුවෙන් මාරුවටද,

(7) බී.පී. ඉන්දික ප්‍රසාද් ඉංජිනේරු සංස්ථාවේ ගිණුම් සහකාර තනතුරේ සිට අමාත්‍ය කාර්ය මණ්ඩලයට සම්බන්ධ වී අමාත්‍යංශයේ මහජන ඉල්ලීම් ලිපි කටයුතු භාර නිලධාරී වශයෙන් සිටියදී PC 2896, PC 9097 දරණ වාහන මාරුවෙන් මාරුවටද,

(8) ඉෂිකා නදී පෙරේරා අමාත්‍ය කාර්යාලයේ නිලධාරිණියක් වශයෙන් සිටියදී JR 5354, 300-5690 දරණ වාහන මාරුවෙන් මාරුවටද,

(9) වෛද්‍ය අචල උපේන්ද්‍ර ජයතිලක අමාත්‍ය වරයාගේ උපදේශක වරයෙකු වශයෙන් සිට HC 2048, HI 2658 දරණ වාහන මාරුවෙන් මාරුවටද,

(10) ඉන්නැකන්දේ සද්ධාතිස්ස හිමි ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික වශයෙන් කටයුතු කරමින් JI 7117, KO 6514, JS 9725, HN 2194, PD 2563, CAC 3327 දරණ වාහන මාරුවෙන් මාරුවටද,

(11) ප්‍රසන්න සංජීව තෙන්නකෝන් අමාත්‍යංශය තුල මාධ්‍ය සම්බන්ධීකරණ වශයෙන් කටයුතු කරමින් KK 8941 දරණ වාහනයද

(12) දුෂ්මන්ත අබේසිංහ අමාත්‍ය වරයාගේ පාර්ලිමේන්තු කටයුතු ලේකම් වශයෙන් කටයුතු කරමින් KE 0231, KR 7730, KA 8125, KS 7735 දරණ වාහන එකක් හැර එකක් මරුවෙන් මාරුවටද,

(13) සම්පත් තිලකරත්න රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ලිපිකරුවෙකු වශයෙන් කටයුතු කරමින් අමාත්‍ය කාර්යාලයට අනුයුක්තව මොරටුව වැඩබිම් සම්බන්ධීකරණ ලේකම් වශයෙන් GR 5774, KT 9085, KI 1610, KS 0097, KQ 7961 දරණ වාහන එකක් හැර එකක් මරුවෙන් මාරුවටද,

(14) ප්‍රසාද් මංජු අමාත්‍ය කාර්ය මණ්ඩලයේ අමාත්‍ය වරයාගේ මාධ්‍ය ලේකම් වශයෙන් කටයුතු කරමින් 250-4713, JY 0359 දරණ වාහන මාරුවෙන් මාරුවටද

(15) රංජිත් එදිරිසිංහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ කළමණාකරණ පුහුණු වශයෙන් කටයුතු කරමින් සිට අමාත්‍ය කාර්යාලය හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අතර සම්බන්ධීකරණ ලේකම් වරයෙකු වශයෙන් කටයුතු කරමින් JZ 2669 දරණ වාහනයද

(16) කේ.එල්.එම්. සමරතුංග රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සහකාර පිරිස් කළමණාකරු වශයෙන් කටයුතු කරමින් HM 6920 දරණ වාහනයද

(17) රංජිත් ගාමිණී වික්‍රමසිංහ අමාත්‍ය වරයාගේ නිල කාර්ය මණ්ඩලයේ සම්බන්ධීකරණ ලේකම් වශයෙන් සිටි කාලය තුල සහ ඉන් පසුව KA 6932, GJ 4501, JN 9942 දරණ වාහන මාරුවෙන් මාරුවටද, පාවිච්චි කර ඇති බවටද අනාවරණය විය.

ඉහත පරිදි අමාත්‍ය කාර්යාලය වෙත ලබාදුන් වාහන පාවිච්චි කල පිරිස අතරින් ශ්‍රී.ඩී. ප්‍රියජීව පෙරේරා මාධ්‍ය ලේකම් වරයා වශයෙන්ද, වෛද්‍ය අචල උපේන්ද්‍ර ජයතිලක මහතා පෞද්ගලික ලේකම් වරයෙකු සහ අමාත්‍ය වරයාගේ උපදේශක වරයෙකු වශයෙන්ද, දුෂ්මන්ත අබේසිංහ මහතා අමාත්‍ය වරයාගේ පාර්ලිමේන්තු කටයුතු ලේකම් වරයා වශයෙන්ද, සම්පත් තිලකරත්න මහතා අමාත්‍ය වරයාගේ නිල නොලත් සම්බන්ධීකරණ ලේකම් වරයෙකු වශයෙන්ද, ප්‍රසාද් මංජු මහතා මාධ්‍ය ලේකම් වරයෙක් වශයෙන්ද, රංජිත් ගාමිණී වික්‍රමසිංහ මහතා අමාත්‍ය වරයාගේ නිල සම්බන්ධීකරණ ලේකම් වරයෙකු වශයෙන්ද එම වාහන පාවිච්චි කල කාලය තුල කටයුතු කර ඇති බවටද අනාවරණය විය. මේ බව ජාතික නිදහස් පෙරමුණේ ලේකම් වරයා වෙතින් ගෙන්වා ගන්නා ලද ලිපියට අනුවද විමර්ශනය තුලින් ලබාගත් ප්‍රකාශ තුලින් අනාවරණය වූ කරුණු මතද අනාවරණය විය.

තවද ඉහත සඳහන් කල වාහන 37 අතරින් වාහන කිහිපයක් ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යංශයේ ලේකම් වරයෙකු වශයෙන් කටයුතු කල විමලසිරි පෙරේරා මහතා විසින් ඔහුගේ නිල වාහනයට අමතරව අංක KL 0812 දරණ වාහනය 2013 ජූලි මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා පාවිච්චි කර ඇති බවටද අනාවරණය විය.

ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යංශයේ හිටපු නියෝජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මහතා ඔහුගේ ලිඛිත ඉල්ලීමකට අනුව අංක 301-6830, 252-1933, LJ 1909 දරණ වාහන නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය වෙත යොමු කිරීමෙන් පසු ඔහුගේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වන ඩබ්.එම්.පී. බණ්ඩාර යන අයටද දේශපාලන හිතවතුන් වන සේනක ප්‍රියදර්ශන, ජී.එච්. කුලතුංග යන අය විසින් පාවිච්චි කර ඇති බවටද විමර්ශන තුලින් අනාවරණය විය. මීට අදාලව තව දුරටත් විමර්ශන කටයුතු සිදුකරමින් පවතී.

එමෙන්ම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ගිවිසුම්ගත නොවූ පරිහාහිර වාහන සඳහාද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් ඉන්ධන ලබාදී ඇති බවටද [redacted] රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

වෙතින් ඉන්ධන ලබාගත් පිරිස ජාතික නිදහස් පෙරමුණේ ක්‍රියාකාරී සාමාජිකයන් බවටද විමර්ශන තුලින් අනාවරණය විය. ඒ අනුව

(1) ජාතික නිදහස් පෙරමුණේ මහ ලේකම් ප්‍රියන්ජිත් විතාරණ මහතා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබාගෙන පාවිච්චි කල GX 6926, KI 7535, KJ 7867, KO 1375, PA 7281 දරණ වාහන සඳහා රුපියල් 1,465,894.62 ක වටිනාකමකින් යුත් ඉන්ධනද

(2) ජාතික නිදහස් පෙරමුණේ පුත්තලම් ආසන සංවිධායක වශයෙන් කටයුතු කල සමන්සිරි හේරත් මහතා අංක PF 3072 දරණ වාහනය සඳහා රුපියල් 189,353.21 ක වටිනාකමකින් යුත් ඉන්ධනද

(3) හෝමාගම ජාතික නිදහස් පෙරමුණේ ආසන සංවිධායක වශයෙන් කටයුතු කල පී.එස්. විජේසිරි හෙවත් දම්පාල යන අය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත අයත් අංක 61-5125 දරණ වාහනය සඳහා රුපියල් 769,360.39 ක වටිනාකමකින් යුත් ඉන්ධනද, ලබා ගැනීමක් සිදුකර ඇති බවට අනාවරණය විය.

තවද ඉහත සඳහන් කරුණු යටතේ විමර්ශන සිදු කිරීමේදී අනාවරණය වූයේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත ලබාදුන් වාහන පාවිච්චි කරන ලද පිරිස අතරින් විමල් වීරවංශ මහතාගේ මාධ්‍ය ලේකම් වන ඩබ්.කේ. ප්‍රසාද් මංජු යන අය නීල ඇමති කාර්ය මණ්ඩලයේ සේවයේ යෙදෙමින් ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයෙන් 2011 සිට 2015 ජනවාරි මස දක්වා ඉන්ධන දීමනාව රු. 1,526,369.30 ක්ද ප්‍රවාහන දීමනාව රු. 1,655,599.08 ක්ද ලබා ගෙන ඉංජිනේරු සංස්ථාවේ 250-4713, JY 0359 දරණ වාහන 2011 පෙබරවාරි මස සිට 2014 නොවැම්බර් මස දක්වා පාවිච්චි කර ඒ සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රුපියල් 1,746,000/- ක මුදලක් පිරිවැයක් වශයෙන් දැරීමට සලස්වා ඇති අතර, ඇමති කාර්ය මණ්ඩලයේ සම්බන්ධීකරණ ලේකම් ඩබ්.එච්.කේ.පී.එස්. විජේසේකර විසින් ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයෙන් 2014 මාර්තු මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා ඔහුගේ නිල තනතුරට හිමි වාහන දීමනාව සහ ඉන්ධන දීමනාව වශයෙන් රුපියල් 521,438.00 ක් ලබමින් සිටියදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් අමාත්‍ය කාර්යාලය වෙත ලබාදුන් වාහන අතරින් එක් වාහනයක් සහ ඊට ප්‍රමාණවත් ඉන්ධන ලබා ගැනීමට සැලැස්වීමෙන් වාහන කුලී දීමනාව වශයෙන් රුපියල් 647,582.53 ක මුදලක්ද, ඉන්ධන දීමනාව වශයෙන් රුපියල් 618,079.48 ක මුදලක්ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අංක JO 9528, KB 0638, KA 7440, KH 0883, KC 2431 දරණ වාහන සඳහා දැරීමට සැලැස්වා ඇති බවටද අනාවරණය විය.

මෙම විමර්ශන තුලින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් කුලී පදනම මත ලබා ගන්නා ලද වාහන අමාත්‍ය කාර්යාලය වෙත හෝ වාහනය පාවිච්චි කල පුද්ගලයා වෙතට ලබා ගැනීමට මූලික වී කටයුතු කර ඇත්තේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන සමන්ත ලොකුහැත්තදීගේ බවටත් ඔහුගේ උපදෙස් මත සහකාර ප්‍රවාහන කළමණාකරු වශයෙන් වැඩකල අයි.ඩී. දයානන්ද මහතා කටයුතු කර ඇති බවටත් අනාවරණය විය.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් අමාත්‍ය කාර්ය මණ්ඩලයට ලබා ගත් වාහන ලබා ගැනීමට මූලික වී කටයුතු කල පුද්ගලයින් වශයෙන් විමර්ශන තුලින් අනාවරණය වූයේ බහුතරයක් එලෙස වාහන පාවිච්චි කරන ලද පුද්ගලයින් බවයි. මෙම අය සඳහා වාහන ලබා දීමට අමාත්‍ය වරයා මූලික වී ඇති බවත්, ඔහු විසින් උපදෙස් ලබාදී ඇති බවත්, විමල් වීරවංශ මහතාගේ ප්‍රකාශය තුලින් පිළිගෙන ඇත. මීට අමතරව ජී.එන්.එස්. මෙන්ඩිස් මහතාගේ ප්‍රකාශය තුලින්ද ආර්.එම්. දුෂ්මන්ත අබේසිංහ මහතාගේ ප්‍රකාශය තුලින්ද වී.එම්. ජයශ්‍රී මෙන්ඩිස් මහතාගේ ප්‍රකාශය තුලින්ද ඉහත වාහන ඔවුන් වෙත ලබා දීමට විමල් වීරවංශ අමාත්‍ය වරයා මූලික වී කටයුතු කල බවට ප්‍රකාශ තුලින් අනාවරණය වී ඇති අතර, අමාත්‍ය වරයාගේ පෞද්ගලික ලේකම් වශයෙන් කටයුතු කල වෛද්‍ය අවල මහතාගේ ප්‍රකාශය තුලින්ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ හිටපු සභාපති ආශු මාරසිංහ මහතාගේ ප්‍රකාශය තුලින්ද වාහන ලබාගැනීම සඳහා අමාත්‍ය වරයා මූලික වී ඇති බවට තව දුරටත් තහවුරු වේ.

ඒ අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලබා ගන්නා ලද වාහන පාවිච්චි කල පුද්ගලයින් 37 දෙනා සහ ඉන්ධන ලබා ගන්නා ලද 03 දෙනාට අදාලව ඔවුන් විසින් මෙම වාහන භාවිතා කිරීම සිදුකලේ කවර අරමුණු සඳහාද යන්න විමර්ශන සිදු කරන ලදී. සිදුකල විමර්ශන තුලින් අනාවරණය වූයේ වාහන පාවිච්චි කරන ලද පිරිසගෙන් බහුතරයක් මෙම වාහන යොදාගෙන ඇත්තේ ජනසෙවන නිවාස ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු සඳහා බවට හුවා දක්වමින් එම පිරිසගේ පෞද්ගලික හා දේශපාලන අරමුණු සඳහා යොදවාගෙන ඇති බවක් අනාවරණය විය.

ඒ වනවිට එම අමාත්‍යාංශය භාරව කටයුතු කලේ විමල් වීරවංශ මහතා වන අතර, ඔහුගේ ප්‍රකාශය තුලින් අනාවරණය වූයේ ඉහත වාහන පාවිච්චි කරන ලද පුද්ගලයින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී එම කටයුතු කාර්යක්ෂම කර ගැනීම සඳහා අධීක්ෂණය කල බවයි. ඒ අනුව මෙම පිරිස විසින් වාහන පාවිච්චි කිරීමට අදාලව අමාත්‍ය වරයා වශයෙන් යම් දැනුමක් තිබූ බවට ඔහුගේ ප්‍රකාශය තුලින් අනාවරණය විය. නමුත් ජනසෙවන සහ අනෙකුත් ව්‍යාපෘති වලට අදාලව ප්‍රධානියා වශයෙන් කටයුතු කල රංජිත් වල්වල ආරච්චි මහතාගේ ප්‍රකාශයට අනුව විමල් වීරවංශ මහතා සඳහන් කරන පරිදි එවැනි ස්වේච්ඡා නිලධාරීන් කිසිවෙකුත් එම කාර්ය සඳහා ඔහු සමග සම්බන්ධ වී කටයුතු නොකල බවට අනාවරණය විය. ඒ අනුව අනාවරණය

වලුයේ ජනසෙවන ව්‍යාපෘතිය සඳහාත්, වෙනත් වැඩබිම් සඳහාත් නීත්‍යානුකූල තත්වයෙන් මෙම වාහන භාවිතා කරන බවට හුවා දක්වමින් මෙම වාහන පාවිච්චි කරන ලද පුද්ගලයින්ගේ දේශපාලන අරමුණු සහ පෞද්ගලික අවශ්‍යතා සඳහා යොදවා ගෙන ඇති බවයි.

අමාත්‍ය වරයා විසින් ජනසෙවන නිවාස ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ඉහත වාහන පාවිච්චි කරන ලද පුද්ගලයින් යොදවාගෙන ඇති බවක් ප්‍රකාශ කරන බැවින් මෙම ව්‍යාපෘතිය සඳහා ස්වේච්ඡා නිලධාරීන් යොදවා ගැනීමක් සහ ඔවුන් වෙත ඉංජිනේරු සංස්ථාව වෙතින් කුලී මුදල් ගෙවන වාහන ලබා දීමට අදාලව පවතින සත්‍ය වශයෙන්ම සිදුව ඇත්තේද යන්න සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන ලදී. මෙම විමර්ශන තුලින් මෙම කාලයට අදාලව අමාත්‍යාංශයේ ලේකම් වරුන් වශයෙන් කටයුතු කල ගෝඨාභය ජයරත්න, විමලසිරි පෙරේරා, නිශ්ශංක නවෝමාල් විජේරත්න යන අයවලුන් කැඳවා විමර්ශන සිදු කරන ලදී. එහිදී අනාවරණය වූයේ අමාත්‍ය වරයාගේ අභිමතය පරිදි ස්වේච්ඡාවෙන් නිලධාරීන් යොදවා ගත හැකි වුවත් ඔවුන් වෙත වාහන ලබාදීම ප්‍රතිපාදන නොමැති බවයි. එය නීත්‍යානුකූල කර ගැනීමට නම් මහා භාණ්ඩාගාර ලේකම් වරයාගෙන් අනුමැතියක් ලබාගත යුතු බවටද අනාවරණය විය. නමුත් එවැනි කටයුත්තක් සඳහා අමාත්‍යංශ ලේකම් වරුන් වශයෙන් කටයුතු කල නිශ්ශංක එන්. විජේරත්න, ගෝඨාභය ජයරත්න, විමලසිරි පෙරේරා යන අය විසින් කටයුතු කර නොමැති බවටද අනාවරණය විය.

තවද මෙම ජනසෙවන ව්‍යාපෘතියේ පසුවිපරම් විමර්ශනය ඒකකය භාරව හා ජනසෙවන අධීක්ෂණ නිලධාරියෙකු වශයෙන් කටයුතු කල ඩබ්.ඒ. රංජිත් විල්වල ආරච්චි මහතා කැඳවා විමර්ශන සිදු කරන ලදී. මෙහිදී අනාවරණය වූයේ විමල් වීරවංශ මහතා අමාත්‍යංශයට අයත් ආයතන 11 තුල සාමාන්‍යාධිකාරී වරු කැඳවා ජනසෙවන ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා උදව් කරන ලෙසට උපදෙස් ලබාදී ඇති බවයි. ඒ අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් කුලී පදනම මත ලබාගත් වාහන ජනසෙවන ව්‍යාපෘතිය සඳහා ලබාදෙන බවට හුවා දක්වමින් එම වාහන පාවිච්චි කල පිරිස එම වාහන පාවිච්චි කරන බවට චේතනාවක් හා අදහසක් ඔහු තුල තිබී ඇති බවත්, ඒ සඳහා ඔහු මූලික වී කටයුතු කර ඇති බවත් අනාවරණය විය. එමෙන්ම ක්‍රියාකාරී කටයුතු සඳහා මැදිහත්වීමක් ඉහත වාහන පාවිච්චි කරන ලද 37 දෙනා සහ ඉන්ධන ලබා ගන්නා ලද 03 දෙනා සිදුකර නොමැති බවට අනාවරණය විය. ඒ අනුව ඉහත වාහන පාවිච්චි කල පුද්ගලයින් පවසන පරිදි ජනසෙවන ව්‍යාපෘතිය තුල කටයුතු කල බව පවසන තොරතුරු අසත්‍ය තොරතුරු බවට විමර්ශන තුලින් අනාවරණය විය.

ඒ අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් ලබා ගන්නා ලද විගණන වාර්තාවේ සඳහන් වාහන 40 අතරින් පරිභාහිර වාහන 03 ක් සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් ඉන්ධන ලබාදී ඇති බවටත් එම ඉන්ධන ලබාගත් වාහන 03 ජාතික නිදහස් පෙරමුණේ ලේකම් වන ප්‍රියන්ජිත් විතාරණ ජාතික නිදහස් පෙරමුණේ පුත්තලම් ආසන සංවිධායක වශයෙන් කටයුතු කල සමන්සිරි හේරත්, ජාතික නිදහස් පෙරමුණේ හෝමාගම ආසන සංවිධායක වශයෙන් කටයුතු කල පී.එස්. විජේසිරි හෙවත් දම්පාල විසින් පාවිච්චි කර ඇති බවත්, වාහන 37 අතරින් වාහන 05 ක් විමල් වීරවංශ මහතාගේ ලගම ඥාතීන් වන ඔහුගේ අක්කා වන සුමනා වීරවංශගේ වැඩිමහල් පුතා වන ලලිත් පුෂ්පකුමාර, බාල පුතා වන විද්‍යා? විමුක්ති වීරවංශ, බිරිඳගේ අක්කාගේ ස්වාමියා වන ඩී.ඩී. ආනන්ද අශෝක කුමාර, ඔහුගේ බාල සහෝදරිය වන නිලානි වීරවංශ සහ ඇයගේ ස්වාමි පුරුෂයා වන පී.පී. ආනන්ද ප්‍රියදර්ශන යන අයද වාහන 10 ක් ජාතික නිදහස් පෙරමුණේ ක්‍රියාකාරී සාමාජිකයන් වශයෙන් කටයුතු කල බස්නාහිර පළාත් සභාව නියෝජනය කල ලාල් කුලරත්න, පාර්ලිමේන්තු මන්ත්‍රී වරයෙකු වශයෙන් කටයුතු කල පියසිරි විජේනායක, සීතාවක ප්‍රාදේශීය සභාව නියෝජනය කල මන්ත්‍රී වරයෙකු වන එල්.බී. කුමාර, කඩුවෙල ආසනයේ හිටපු සම්බන්ධීකරණ නිලධාරියෙකු වන නුවන් ඉන්දික පෙරේරා ඇතුළු පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයින් වන පී.එස්. විජේසිරි, විරාජ් සංජීව, ඩී.ඩී.ජී. ජයවර්ධන, කේ.ඩී.යූ. ජයසේන යන අයවලුන් විසින් පාවිච්චි කර ඇති බවටත් විමර්ශන තුලින් අනාවරණය විය.

එමෙන්ම ඉහත සඳහන් කල විමල් වීරවංශ මහතාගේ ලගම ඥාතීන් සහ පක්ෂ ක්‍රියාකාරී පිරිස අතරින් කිහිප දෙනෙකුට අමාත්‍යංශය වෙත අයත් දෙපාර්තමේන්තු, සංස්ථා, ආයතන තුලද රැකියා ලබාදීම සඳහා අමාත්‍ය වරයා මූලික වී කටයුතු කර ඇති අතර, ඒ අනුව එම පුද්ගලයින් වෙත වාහන ලබාදීම තුල සෘජු මැදිහත් භාවයක් අමාත්‍ය වරයා තුල තිබී ඇති බවද සමහර වාහන ඔහුගේ උපදෙස් මත ලබාගෙන ඇති බවද අනාවරණය විය. එමෙන්ම මෙම වාහන අතරින් වාහන 05 ක් අමාත්‍ය වරයාගේ ලගම ඥාතීන් විසින් පාවිච්චි කිරීමෙන්ද, මෙම වාහන අතරින් වාහන 05 ක් ජාතික නිදහස් පෙරමුණේ ප්‍රකට දේශපාලන ක්‍රියාකාරීන් විසින් පාවිච්චි කිරීම තුලින්ද, එවැනි ක්‍රියාකාරී 03 දෙනෙකු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ඉන්ධන ලබා ගැනීම තුලින්ද, වාහන 06 ක් ඔහුගේ ලගම හිතවතුන් සහ ඔහුගේ නිල කාර්ය මණ්ඩලයේ වගකීම් දැරූ තනතුරු හෙබවූ පුද්ගලයින් වීම තුලින්ද ඔහුගේ දැනුවත් භාවයෙන්, ඔහු මෙම කටයුතු සඳහා මූලික වී ඇති බවත්, සිදුකල විමර්ශන තුලින් අනාවරණය විය.

මෙහිදී මා විසින් මුල් බී වාර්තාව මගින් ගරු අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකරුවන් වශයෙන් මුල් පැමිණිල්ල තුල නම්කර ඇති පුද්ගලයින් අතරින් ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යංශයේ හිටපු අමාත්‍ය විමල් වීරවංශ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන සමන්ත ලොකුහැන්නදිගේ මූලික වී කටයුතු කර ඇති බවට විමර්ශන තුලින් අනාවරණය විය.

### හිටපු අමාත්‍ය විමල් වීරවංශ සම්බන්ධව විමර්ශනයේදී අනාවරණය වූ චෝදනා

ඉහතින් සරුකු ඉදිරිපත් කිරීමට අදාලව මෙසේ සිදු කරන ලද විමර්ශන තුළින් අනාවරණය වූයේ ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය වරයා වශයෙන් කටයුතු කල විමල් වීරවංශ මහතා විසින් 2011 ජනවාරි සහ 2014 දෙසැම්බර් අතර කාලය තුල රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් කුලී පදනම මත ලබාගත් වාහන 37 ක් හෝ ඊට ආසන්න සංඛ්‍යාවක් අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත නීත්‍යානුකූල නොවන ආකාරයෙන් එනම් මහා භාණ්ඩාගාර ලේකම් වරයාගේ නිසි අනුමැතියකින් තොරව එසේ වාහන ලබා ගැනීම සඳහා මූලික වී කටයුතු කරමින් එලෙස වාහන ලබා ගැනීම තුල වාහන කුලිය වශයෙන් රුපියල් 58,152,133.72 ක මුදලක්ද, ඉන්ධන පිරිවැය වශයෙන් රුපියල් 33,483,457.31 ක මුදලක්ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත දැරීමට සැලැස්වීමෙන්ද, එමෙන්ම පක්ෂ ක්‍රියාකාරී සාමාජිකයින් 03 දෙනෙකු වෙත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් ඉන්ධන ලබා ගැනීම සඳහා ඔහුගේ දැනුවත් භාවය තුල මූලික වී කටයුතු කරමින් ඒ සඳහා රුපියල් 2,424,608.22 ක මුදලක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පිරිවැය වශයෙන් දැරීමට සැලැස්වීමෙන්ද, ඔහු විසින් සාපරාධී සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම, වංචා කිරීම සඳහා අධාර අනුබල දීම සිදු කිරීමෙන්ද, ඔහුගේ කාර්ය මණ්ඩලයේ මාධ්‍ය ලේකම් වශයෙන් කටයුතු කල ඩබ්.කේ. ප්‍රසාද් මංජු යන අය හට 2011 පෙබරවාරි මස සිට 2014 නොවැම්බර් මස දක්වා ඔහුගේ නිල භාවිතයට හිමි වාහනය වෙනුවට වාහන කුලී දීමනාව වශයෙන් සහ ඉන්ධන දීමනාව වශයෙන් රුපියල් 1,746,000.00 ක් ලබා ගනිමින් සිටියදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් අමාත්‍ය කාර්යාලය වෙත ලබාදුන් වාහන අතරින් එක් වාහනයක් සහ ඊට ප්‍රමාණවත් ඉන්ධන ලබා ගැනීමට සැලැස්වීමෙන් ඔහු වෙත සාපරාධී සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීමට ආධාර අනුබල දීමක් සිදුකර ඇති බවටද, එමෙන්ම ඔහුගේ කාර්ය මණ්ඩලයේ සම්බන්ධීකරණ ලේකම් වරයෙකු වශයෙන් කටයුතු කල ඩබ්.එච්.කේ.පී.එස්. විජේසේකර යන අය 2014 මාර්තු මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා ඔහුගේ නිල භාවිතයට හිමි වාහන දීමනාව සහ ඉන්ධන දීමනාව වශයෙන් රුපියල් 521,438.00 ක් ලබමින් සිටියදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් අමාත්‍ය කාර්යාලය වෙත ලබාදුන් වාහන අතරින් එක් වාහනයක් සහ ඊට ප්‍රමාණවත් ඉන්ධන ලබා ගැනීමට සැලැස්වීමෙන් ඔහු වෙත සාපරාධී සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීමට ආධාර අනුබල දීමක් සිදුකර ඇති බවටද, එමෙන්ම හෝමාගම ආසන සංවිධායක වශයෙන් සහ පක්ෂයේ එවකට ක්‍රියාකාරී සාමාජිකයෙකු වශයෙන් කටයුතු කල පී.එස්. විජේසිරි හෙවත් දම්පාල යන අය විසින් 2013 මාර්තු මස සිට 2014 අගෝස්තු මස දක්වා අතර කාලය තුල රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සතු 61-5125 දරණ වාහනය සංස්ථාවේ නිලධාරියෙකු වශයෙන් නොසිට පාවිච්චි කරමින් ඒ සඳහා රුපියල් 769,360.39 ක රජයේ මුදලක් වැය වන ලෙස ඉන්ධන පිරිවැයක් එම වාහනය සඳහා දරමින් සිටියදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් කුලී පදනම මත අමාත්‍ය කාර්යාලය වෙත ලබාදුන් වාහනයක් ඔහු වෙත ලබාදී ඔහු වෙත සාපරාධී සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීමට ආධාර අනුබල දීමක් සිදුකර ඇති බවටද, එමෙන්ම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන ඔහුගේ අභිමතය පරිදි කුලී පදනම මත ලබා ගන්නා ලද වාහන අමාත්‍ය කාර්යාලය වෙත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සාමාන්‍යාධිකාරී වරයා හෝ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති වරයාගේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ විධිමත්ව ලබාගන්නා ලද අවසරයකින් තොරව ලබාදීම තුලින්ද එලෙස ලබාදුන් වාහන සඳහා ඉන්ධන ලබාදීම තුලින්ද සාපරාධී සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීමට ආධාර අනුබල දීමෙන්ද වරදක් සිදුකර ඇති බවටත්,

### සමන්ත ලොකුහැන්නදිගේ සම්බන්ධව විමර්ශනයේදී අනාවරණය වූ චෝදනා

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන ඔහුගේ අභිමතය පරිදි කුලී පදනම මත ලබා ගන්නා ලද වාහන අමාත්‍ය කාර්යාලය වෙත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සාමාන්‍යාධිකාරී වරයා හෝ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති වරයාගේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ විධිමත්ව ලබාගන්නා ලද අවසරයකින් තොරව ලබාදීම තුලින්ද එලෙස ලබාදුන් වාහන සඳහා ඉන්ධන ලබාදීම තුලින්ද සාපරාධී සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීමට ආධාර අනුබල දීමක් සිදුකර ඇති බවටද,

### ඩබ්.කේ. ප්‍රසාද් මංජු සම්බන්ධව විමර්ශනයේදී අනාවරණය වූ චෝදනා

විමල් වීරවංශ මහතාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ මාධ්‍ය ලේකම් වශයෙන් කටයුතු කල ඩබ්.කේ. ප්‍රසාද් මංජු යන අය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් කුලී පදනම මත ලබාගත් වාහනය 2011 පෙබරවාරි මස සිට 2014 නොවැම්බර් මස දක්වා වාහන කුලිය සහ ඉන්ධන වශයෙන් රුපියල් 1,746,000.00 ක මුදලක් ගෙවීමට සැලැස්වමින් එම වාහනය පාවිච්චි කරමින් සිටියදී අමාත්‍යාංශය වෙතින් ඉහත භාවිතයට අදාල නිල රථය සඳහා 2011 සිට 2015 වර්ෂය දක්වා ඉන්ධන දීමනාව වශයෙන් රුපියල් 1,526,369.30 ක රජයේ මුදලක්ද, ප්‍රවාහන දීමනාවක් වශයෙන් රුපියල් 1,655,599.08 ක රජයේ මුදලක්ද ලබා ගැනීම තුලින් සාපරාධී සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීම සිදුකර ඇති බවත් අනාවරණය විය.

**ඩබ්.එච්.කේ.පී.එස්. විජේසේකර සම්බන්ධව විමර්ශනයේදී අනාවරණය වූ චෝදනා**

හිටපු අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සම්බන්ධීකරණ ලේකම් වරයෙකු වශයෙන් කටයුතු කල ඩබ්.එච්.කේ.පී.එස්. විජේසේකර යන අය 2014 මාර්තු මස සිට 2014 ඔක්තෝම්බර් මස දක්වා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් වාහන කුලී මුදල සහ ඉන්ධන වශයෙන් රුපියල් 1,858,728.84 ක මුදලක් රජය විසින් කුලී ගෙවමින් තිබූ වාහනයක් පාවිච්චි කරමින් සිටියදී එම කාලයට අදාලව ඔහුගේ නීල කඩතුරට හිමි වාහනය සඳහා ගෙවන ඉන්ධන දීමනාව වශයෙන් රුපියල් 281,438.00 ක රජයේ මුදලක්ද වාහන කුලී දීමනාව වශයෙන් රුපියල් 240,000.00 ක රජයේ මුදලක්ද ලබා ගැනීම තුලින් සාපරාධී සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීම සිදුකර ඇති බවටත් අනාවරණය විය.

**පී.එස්. විජේසිරි හෙවත් දම්සාලු සම්බන්ධව විමර්ශනයේදී අනාවරණය වූ චෝදනා**

හෝමාගම ආසන සංවිධායක වශයෙන් සහ පක්ෂයේ එවකට ක්‍රියාකාරී සාමාජිකයෙකු වශයෙන් කටයුතු කල පී.එස්. විජේසිරි හෙවත් දම්සාලු යන අය විසින් 2013 මාර්තු මස සිට 2014 අගෝස්තු මස දක්වා අතර කාලය තුල රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සතු 61-5125 දරණ වාහනය සංස්ථාවේ නිලධාරියෙකු වශයෙන් නොසිට පාවිච්චි කරමින් ඒ සඳහා රුපියල් 769,360.39 ක රජයේ මුදලක් වැය වන ලෙස ඉන්ධන පිරවයත් එම වාහනය සඳහා දැරීමට සැලැස්වීමෙන්ද එම කාලයට අදාලව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් අමාත්‍ය කාර්යාලය වෙත ලබාදුන් HR 7619 සහ HN 4098 දරණ වාහන 02 පාවිච්චි කරමින් ඒ සඳහා රුපියල් 1,657,861.04 ක රජයේ මුදලක් වශයෙන් රුපියල් 2,427,221.43 ක රජයේ මුදලක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත දැරීමට සැලැස්වීමෙන් සාපරාධී සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීම සිදුකර ඇති බවටත් අනාවරණය විය.

<u>ඉහත කරුණු සනාථ කිරීම සඳහා ඉදිරිපත් වූ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සම්පිණ්ඩනය</u>

01. **නියඟංග කාවෝමිගල් විජේරත්න අංක 465, ගාලු පාර, රාවතාවත්ත, මොරටුව.**

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් 2007.01.31 දින පත් වී ඇත. ඒ වන විට එම අමාත්‍යාංශය භාරඅමාත්‍යවරයා වශයෙන් රාජිත සේනාරත්න මහතා කටයුතු කර ඇති අතර, 2010 පැවති මහ මැතිවරණයෙන් පසු ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය වශයෙන් එවකට අමාත්‍යවරයා වශයෙන් සිටි විමල් වීරවංශ මහතා යටතේ 2010.04.25 සිට 2010.11.22 දක්වා අමාත්‍යාංශ ලේකම් වශයෙන් කටයුතු කර ඇත.

අමාත්‍යාංශයේ ලේකම්ගේ කාර්යභාරය වශයෙන් අමාත්‍යතුමාගේ විධානයට හා පාලනයට යටත්ව අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන අධීක්ෂණය කිරීම බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 වගන්තිය යටතේ සඳහන් වන බවද පවසයි. ඒ අනුව ජනාධිපති ලේකම් වරයා හා සම්බන්ධ වීමත් මුදල් පනතට අනුව අමාත්‍යාංශය තුළ ප්‍රධාන ගිණුම් නිලධාරි වශයෙන් මහාභාණ්ඩාගාරයෙන් හිමි වන මුදල් අමාත්‍යාංශය තුල මෙන්ම දෙපාර්තමේන්තු තුල නිවැරදි අයුරින් වියදම් වන්නේද යන්න සොයා බැලීමද සිදුකල යුතු බව පවසයි.

එසේ නමුත් ව්‍යවස්ථාපිත ආයතන තුළ මූල්‍ය පරිපාලන කටයුතු සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත බලය ලබා දී ඇති බැවින් එහි මූල්‍ය පරිපාලන කටයුතු සීමාව ඉක්මවීමෙන් පසු පමණක් ලේකම්වරයා වෙත යොමු වීමක් සිදු වෙන බවද, තමාගේ මතයට අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රජයේ ආධාරමුදල් එනම් මහා භාණ්ඩාගාරයේ මුදල් වෙන් කිරීමක් සිදු නොවූන බවද පවසයි.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ කටයුතු කිරීමේදී අනුමත මුදල් ප්‍රමාණය ඉක්මවා යන අවස්ථාවලදී පමණක් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත වගකීම් පැවරීම සිදු වන බවද එයට හේතුව එවැනි ටෙන්ඩර් මණ්ඩල අනුමත කිරීමේ බලය ලේකම්වරයා වෙත පවතින බැවින් බව ප්‍රකාශ කරයි. ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය වෙත අයත් සංස්ථාවන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ සංස්ථාව, ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය බිහි කිරීම සිදු කර ඇත්තේ 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ වන බැවින්, මෙම පනතේ 08 වන වගන්තිය අනුව ආයතනය පාලනය කිරීමේ බලය හා ආයතනයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දී ඇත. ඒ අනුව සංස්ථාව තුල මුදල් පරිපාලනය කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලයට හිමි වේ. මෙම පනතේ 31 වගන්ති අනුව අමාත්‍යවරයාට පාලනය කිරීමට අදාළ සාමාන්‍ය නියෝග සහ අධ්‍යක්ෂ මණ්ඩලය සමග සාකච්ඡා කොට විශේෂ නියෝග ලබා දීමේ හැකියාව සතු වෙන බවද, මහා භාණ්ඩාගාරය විසින් අයවැය තුලින් අමාත්‍යාංශය තුල තමා රාජකාරි කරන කාලය තුල රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත අයවැය ප්‍රතිපාදන තුලින් වෙන් කිරීමක් සිදු කර නැති බවද ප්‍රකාශ කරයි.

නමුත් විශේෂ ව්‍යාපෘති සඳහා වෙන් කිරීමක් සිදු වන අතර පුනරාවර්තන වියදම් වශයෙන් වැටුප්, යටිතල පහසුකම්, නඩත්තු සේවා, වාහන කුලියට ලබා ගැනීම වැනි කටයුතු සඳහා වෙන් කිරීමක් සිදු වන්නේ නැති බවද, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වාණිජමය පදනම මත ක්‍රියාකළ යුතු සංස්ථාවක් බැවින් සංස්ථාව තුල පුනරාවර්තන වියදම් සංස්ථාව උපයන ආදායම මගින් පියවා ගැනීම සිදු කළ යුතු බවද, ඒ අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත කොන්ත්‍රාත් පදනම මත ලැබෙන ඉදිකිරීම් ව්‍යාපෘති වලින්

උපයා ගන්නා මුදල් පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් ලෙස යොදා ගැනීම සිදු කරනු ලබන බවත් මුදල් පනත අනුව වියදම් වියවා ගැනීමෙන් පසු අතිරික්තය මහා භාණ්ඩාගාරය වෙත ලබා ගැනීමට බලය ඇති බවද පවසයි. සංස්ථාව තුල සිදු වන සියලු මිලදී ගැනීමට අදාළ ක්‍රියාදාමයන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට යටත්ව සිදු විය යුතු බවද ඒ අනුව අමාත්‍යාංශ ලේකම් වෙත පැවරී ඇති ප්‍රධාන ගිණුම් නිලධාරි වගකීම (ගනන් දීමේ නිලධාරි) ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල පමණක් වගකීම දරණ අතර එලෙස කටයුතු කල යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයට අනුමත ප්‍රමාණය ඉක්මවා ගිය අවස්ථා වලදී බව පවසයි. එමෙන්ම රජයේ විගණන වාර්තාවට අනුව ලබා දෙනු ලබන නිර්දේශන වලට අනුව කටයුතු කිරීමේ වගකීමද පැවරෙන බවද, සාමාන්‍යයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වාර්ෂිකව රාජ්‍ය විගණනයට ලක් විය යුතුබවද පවසයි.

අමාත්‍යවරයා වෙත සහ අමාත්‍ය කාර්යය මණ්ඩලය වෙත පාවිච්චි කළ හැකි වාහන සංඛ්‍යාව කොපමණද යන්න සදහන් වූ ජනාධිපති චක්‍ර ලේඛන මගින් තීරණය කර ඇති බවද, එම වාහන සීමාව ඉක්මවා වාහන ලබා ගැනීමක් සිදු කරන්නේ නම් ඒ සදහා විශේෂ අවසරයක් ජනාධිපති ලේකම් වරයාගෙන් ලබා ගත යුතු වන බවද, එලෙස විශේෂ අවසරයක් ලබා නොගෙන වාහන පාවිච්චි කිරීමක් සිදු කර තිබෙනම් එලෙස පාවිච්චි කල අමාත්‍යවරයා විසින් ඒ සදහා වගකීම දැරිය යුතු බවද ප්‍රකාශ කරයි.

තමාගේ මතකයට අනුව තමා කිසිදු අවස්ථාවක මෙවැනි ඉල්ලීමක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් විශාල වාහන ප්‍රමාණයකට අදාලව සිදුකර නැති නමුත් අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය තුල සිල වාහන සිමි අය සදහා ඉහත වාහන සීමාවට යටත්ව වාහන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ලබා ගැනීමේ කටයුතු සදහා සම්බන්ධවීමක් සිදුවිය හැකි බවද ප්‍රකාශ කරයි.

මෙලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් වාහන ලබා ගැනීමක් සිදුකර අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත ලබා දීමක් සිදුකිරීම තුල එම කටයුත්ත සදහා අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් වරයා හෝ අමාත්‍යවරයා විසින් වගකිව යුතු බවද, තමා සිටි කාලය තුල අමාත්‍ය වරයාගේ පෞද්ගලික ලේකම් ලෙස කටයුතු කලේ මෛද්‍රා අචල මහතා වන බවද, අමාත්‍යවරයා වෙත හා කාර්ය මණ්ඩලය වෙත අනුමත වී ඇති වාහන සංඛ්‍යාවට අමතරව ඔහුගේ වාහන සංචිතයට අමතර වාහන සංඛ්‍යාවක් ලබාදීමේ හැකියාවක් අමාත්‍යාංශය වෙත නොමැති අතර අමාත්‍යාංශය වෙත ලබාදිය හැක්කේ ඔහුට හා කාර්ය මණ්ඩලයට අනුමත වාහන සංඛ්‍යාව පමණක් වගන බවද පවසයි.

අමාත්‍යාංශය වෙත අයත් වාහන වැඩි ප්‍රමාණයක් එනම් අනුමත වාහන ප්‍රමාණයට වඩා වැඩි සංඛ්‍යාවක් අමාත්‍ය වාහන සංචිතය තුලට ලබා ගැනීමක් සිදුකර තිබේ නම් එලෙස වාහන ලිඛිත අවසරයක් තුල ලබාගෙන තිබේ නම් එහි යම්කිසි සාධාරණයක් තිබෙන බවත් එසේ නොමැතිව ලබා ගත්තේ නම් ඒ සදහා අමාත්‍යාංශයේ වාහන සංචිතය භාර නිලධාරියා හා ලබා ගැනීම සිදුකරන අමාත්‍ය වරයා විසින් වගකීම දැරිය යුතු බවද, රජය සතු යම් වාහනයක් අමාත්‍ය වාහන සංචිතය වෙත ලබා ගැනීමෙන් අනතුරුව රජයේ නිලධාරියෙක් නොවන පරිබාහිර පුද්ගලයෙක් වෙත ලබාදී තිබේනම් එය වරදක් බවද, ලබාදිය හැක්කේ චක්‍රලේඛන අනුව වාහන පාවිච්චි කිරීමේ බලයක් පවතින රජයේ නිලධාරීන් වෙත පමණක් බව පවසයි.

අමාත්‍යාංශය මගින් ආරම්භ කරන විවිධ ව්‍යාපෘති උදාහරණ වශයෙන් ජනසෙවන ව්‍යාපෘතිය සදහා අමාත්‍යාංශයේ හෝ අමාත්‍යාංශයට අයත් සංස්ථා, ආයතන, දෙපාර්තමේන්තු, තුල සේවය කරන නිලධාරියෙක් හැර ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන යම් පරිබාහිර පුද්ගලයෙක් වෙත ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සදහා බලයක් ලබාදීමේ හැකියාවක් අමාත්‍යවරයා වෙත නොමැති අතර එවැනි ව්‍යාපෘති සදහා වගකීයන අධීක්ෂණය කරන නිලධාරීන් අමාත්‍යාංශය වෙතින් හෝ එයට අනුබද්ධ ආයතන වෙතින් පත්කර ඇති අතර එවැනි කටයුතු අධීක්ෂණය කිරීම සදහා අමාත්‍යාංශය තුලින් පිටතින් පහසුකම් ලබාදී යොමුකිරීම නීත්‍යානුකූල නොවන ක්‍රියාවලියක් බව පවසයි.

ජනසෙවන වැනි විශේෂ ව්‍යාපෘතියක් සදහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ පුද්ගලයින් වෙත එහි අධීක්ෂණ කටයුතු සදහා වාහන ලබාදීමක් සිදුකිරීමට අවශ්‍යනම් ඔවුන් වෙත ලබාදෙන වාහන රජයේ වාහන හෝ රජය විසින් කුලී ගෙවන වාහන බැවින් අමාත්‍ය වරයා විසින් අමාත්‍යාංශ ලේකම් වරයා හරහා මහා භාණ්ඩාගාර ලේකම් වරයාගෙන් විශේෂ අනුමැතියක් ලබා ගැනීම තුල මෙලෙස වාහන ලබාදීම නීත්‍යානුකූල කර ගත හැකි බවද පවසයි.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලයට පිටින් රැකියාවන් සදහා පුද්ගලයන් බදවා ගැනීමේ හැකියාවක් නැතිබවද, නමුත් වැඩ කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කිරීම සදහා අවශ්‍ය සේවකයන් එම ව්‍යාපෘති අවසන් වන තෙක් තාවකාලික පදනම මත බදවා ගැනීමේ හැකියාවක් ඇති බවද, සදහන් කල පරිදි සේවකයන් බදවා ගැනීම එම අය සදහා වාහන පහසුකම් ලබාදීම, අමාත්‍ය ලේකම් වරයාගේ අනුදැනුම මත සිදු නොවූනා නම් ඒ සදහා වගකිව යුත්තේ එම ආයතන වල ප්‍රධානීන් සහ ඒ පහසුකම් පාවිච්චි කල අය හා එම පහසුකම් ලබා දීමට නියෝග දුන් අයවළුන් වන බවද පවසයි.

වාර්ෂිකව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව උපයාගන්නා මුදලින් නීත්‍යානුකූල වියදම් වියවා ගැනීමෙන් පසු ඉතිරි වන මුදලත් මහා භාණ්ඩාගාරය වෙත ලබා ගැනීමට බලය ඇති බැවින් එම මුදල් නීත්‍යානුකූල නොවන කාර්යන් සදහා පාවිච්චි කිරීම අවභාවිතයක් වශයෙන් හැදින්විය හැකි බවද පවසයි.

**02. සුබසිංහ මුදියන්සේලාගේ ගෝඨාභය ජයරත්න අංක 10/01, සිවලි මාවත, වෙවැල්දූව, කුනුපිටිය, වත්තල. ඉංජිනේරු සේවා පොදු පහසුකම් ආමාත්‍යාංශයේ හිටපු ලේකම්**

2010.12.23 දින සිට 2012 මැයි [illegible] දක්වා නිවාස ඉදිකිරීම් ඉංජිනේරු සේවා පොදු පහසුකම් ආමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කර ඇත .ආමාත්‍යවරයකු විසින් සිය පෞද්ගලික නිල කාර්යය මණ්ඩලය තෝරා ගෙන පත්කිරීම සඳහා ආමාත්‍යාංශ ලේකම්වරයා වෙත දන්වන බවද, ඒ අනුව එම තොරතුරු පරීක්ෂා කොට අදාළ විධිවිධාන යටතේ ආමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත්කරීම් සිදු කරනු ලබන බවද ආමාත්‍යවරයකුට ජනාධිපතිලේකම් කාර්යාලයෙන් නිකුත් කර ඇති චක්‍ර ලේඛන වල ලිඛිත උපදෙස් පරිදි 15 දෙනෙක්ගෙන් සමන් විත කාර්යය මණ්ඩලයක් පත් කර ගත හැකි බවද, ඒ අනුව පෞද්ගලික ලේකම්වරයෙක්, සම්බන්ධීකරණ ලේකම්වරු 02 දෙනෙක්, එක් මාධ්‍ය ලේකම්වරයෙක්, එක් මහජන සම්බන්ධතා නිලධාරියෙක්, පෞද්ගලික සහකාර වරයෙක් කළමනාකාර සහකාර 05 ක් කාර්යාල කාර්යය සහයක 02ක් ආරක්ෂක රථයේ රියදුරු හැර රියදුරු 02 ක් වශයෙන් 15 දෙනෙක් පත් කර ගත හැකි බවද එම තනතුරු අනුව 01 සිට 05 දක්වා නිලයන් සඳහා නිල වාහන හිමිබවද ඒ සඳහා අමාත්‍යාංශයට ඇති වාහන ලබා දෙන බවද පවසයි.

නිවාස අමාත්‍යාංශයට අයත්ව තිබූ සංස්ථා හා මණ්ඩල වශයෙන් රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ස්වාධීන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, ඕෂන්විව් ආයතනය වේ. මෙම ආයතන වලින් වාහන ආමාත්‍යාංශයෙන් සිදු කරන සංවර්ධන කටයුතු සඳහා රාජකාරී වශයෙන් යොදවා ගැනීමේ බලතල ආමාත්‍යාංශ ලේකම් වෙත ලබා දී ඇත.

ඇමතිවරයාට නිල වශයෙන් හිමි වාහන හා ආමාත්‍ය කාර්යය මණ්ඩලයට නිල වශයෙන් හිමි වාහන වෙන් කර දීමේ වගකීම ලේකම් වරයාට පැවරී තිබෙනවා. ඒ අනුව නීතිමය වශයෙන් හිමි වාහන පමණක් ලබා දී ඇති බවද ආමාත්‍යාංශය තුළ නියමිත වාහන සංචිතයක් ආරම්භයේ නොතිබූ බැවින් වාහනයක් පාවිච්චි කිරීමට නිල වශයෙන් හිමි අයට වාහනයක් ලබා දීමට හැර වෙනත් අය සඳහා ලබා දීමට වාහන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ලබා ගෙන නොමැති බවද පවසයි.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරනු ලබන්නේ ආමාත්‍යවරයා විසින් වන බැවින්. මෙම වාහන තමාගේ අනුදැනුමකින් තොරව ආමාත්‍යවරයා විසින් ලබා ගෙන ඇතැයි විශ්වාස කරන බවද පවසයි. වලාකුලුගේ පත්මසිරි මහතා වෙත ආමාත්‍යවරයාගේ ආරක්ෂක රථයේ රියදුරු වශයෙන් පත්වීම් ලිපිය තමා විසින් අත්සන් කර ඇති බවත් එවකට ආමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් වශයෙන් කටයුතු කළ ආචාර්ය අචල උපේන්ද්‍ර ජයතිලක මහතාගේ ඉල්ලීම් ලිපියකට අනුව 2011.06.01 දින එම පත්වීම සිදු කර ඇති බවද පවසයි. ආමාත්‍ය තුමාගේ උපදෙස් අනුව මෙම රියදුරු පත් කිරීමට ඉල්ලීම කරන බව ලිපියේ සඳහන් කර ඇති බැවින් ආමාත්‍යවරයාගේ දැනුම තුළ පෞද්ගලික ලේකම් විසින් මෙම ඉල්ලීම සිදු කර ඇති බව පැහැදිලි වන බවද පවසයි.

තමා ස්ථිර ලේකම් වශයෙන් කටයුතු කළ කාලය තුළ අංක KQ-5454, KM-5597 දරණ වාහන දෙක මිලදී ගෙන ඇමතිවරයාට නිල වශයෙන් රාජකාරී කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍ර ලේඛ උපදෙස් පරිදි මෙම වාහන ලබා දී ඇති බවද, එම වාහන ඔහු පත් කිරීමට ප්‍රකාශ කර ඇති ගැසට් පත්‍රයේ රාජකාරී කිරීම සඳහා යොදවා ගැනීමට පමණක් බලය ලබා දී ඇති බවද අනුමත වාහන වලට පරිබාහිරව පෞද්ගලිකව තබා ගැනීමට ඇමතිවරයාට බලයක් නැති බවද පවසයි. වාහනයක් යනු දේපලක් බැවින් වාචිකව අවසර ලබා ගත්තත් වාහනය පරිහරනය කාර්මේදී ඇති වන අනෙකුත් සියලු අවශ්‍යතා සඳහා ලිඛිත නියෝග අවශ්‍ය වන බැවින් එය ලිඛිතව දැනුම් දිය යුතු බවද පවසයි.

ප්‍රශ්නගත කාල වකවානුව තුළ ආමාත්‍යාංශයේ මූලික සංවර්ධන වැඩසටහන ලෙස ජන සෙවන වැඩ සටහන ක්‍රියාත්මක වූ බවද, එහි අරමුණු හා ඉලක්ක ප්‍රගති පාලනය හා ඉටු කර ගැනීම සම්බන්ධ කිරීම ආමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ වගකීමක් වන බවද, එය මාසිකව ප්‍රගති සමාලෝචනය කිරීම කරනු ලබන බවද, එනමුත් ආමාත්‍යාංශයේ නිලධාරීන්ට අමතරව ආමාත්‍යවරයාගේ අභිමතය අනුව පරිබාහිර අය පත් කරමින් ප්‍රගතිය පරීක්ෂා කිරීමේ වැඩපිලිවෙල සම්බන්ධයෙන් ආමාත්‍යාංශයේ සම්බන්ධයක් නොමැති බවද, මෙලෙස වාහන ලබා දෙන්නේ නම් නීත්‍යානුකූල අවසරයක් ආමාත්‍යාංශ ලේකම් හරහා මහා භාණ්ඩාගාර ලේකම් ගෙන් හෝ ජනාධිපති ලේකම්ගෙන් ලබා ගත යුතු නමුත් එවැනි අවසරයක් තමා සිටි කාලය තුළ ලබා නොගත් බවද පවසයි. ඒ අනුව

ඇමතිවරයාගේ අනුමත නීත්‍යනුකූල කාර්යය මණ්ඩලයේ හැර අන් අයට වාහන ලබා දීම නීත්‍යානුකූල නැති බවත් නියමිත කාර්යය පටිපාටියෙන් පරිබාහිරව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් වාහන ලබා ගැනීමේ ක්‍රියාවලියට අදාලව එවකට සිටි ආමාත්‍යවරයා ඒ සම්බන්ධයෙන් වගකිව යුතු බවත් පවසයි.

**03. පාවුලු හේවාගේ ලයනල් විමලසිරි පෙරේරා නො.12, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල. (නිවාස ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ හිටපු ලේකම්**

2012.06.17 දින නිවාස ඉදිකිරීම් ඉංජිනේරු සේවා පොදු පහසුකම් ආමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත් වී ඇත. ආමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තනතුරේ පත්වීම් බලධාරියා වන්නේ ජනාධිපතිවරයාවන බවද, ආමාත්‍යවරයකු විසින් සිය නිල කාර්යය මණ්ඩලය තෝරා ගෙන පත්කිරීම සඳහා ආමාත්‍යාංශ

ලේකම්වරයා වෙත දැන්වීමෙන් අනතුරුව තොරතුරු පරීක්ෂා කොට අදාළ විධිවිධාන යටතේ පත් කිරීම් කරනු ලබන්නේ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් බවද පවසයි.

නිවාස අමාත්‍යාංශයට අයත්ව තිබූ සංස්ථා හා මණ්ඩල වශයෙන් රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ස්වාධිපත්‍ය අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, ඕෂන්විව් ආයතනයන් වන බවද, මෙම ආයතන වලින් වාහන අමාත්‍යාංශයෙන් සිදු කරන රාජකාරි සඳහා යොදවා ගැනීමේ බලතල අමාත්‍යාංශ ලේකම් වෙත ලබා දී ඇති නමුත් නිසි ක්‍රමවේදයකට හුදු අවශ්‍ය අවශ්‍යතාවය සඳහා පමණක් එය ලබා ගත හැකිබවද පවසයි.

තමාගේ පූර්වගාමී ලේකම් වශයෙන් කටයුතු කර තිබුණේ ගෝධාභය ජයරත්න මහතාවන බවද, අමාත්‍යවරයාට නිල වාහන තුනක් සඳහා හිමිකම් තිබෙන බවද, එමෙන්ම වාහන සංචිතයට අවශ්‍යතාවය මත පෞද්ගලික ලේකම්ගේ ඉල්ලීමට අනුව අමාත්‍යාංශයට අයත් වෙනත් ආයතන සමාගම් තුලින් වාහන ලබා ගැනීමක් සේවා අවශ්‍යතාවය මත අදාළ ආයතන ප්‍රධානීන්ගෙන් විමසා ඔවුන්ගේ කාර්යයන් වලට බාධා නොමැති වන පරිදි ලබා ගත හැකි බවද පවසන අතර නිවැරදි ක්‍රමය වන්නේ අමාත්‍යාංශ ලේකම්වරයා මගින් අදාළ ආයතනය දැනුවත් කර ලබා ගැනීමබවද පවසයි.

අනුමත කාර්යය මණ්ඩලය සඳහා අමාත්‍යවරයාගේ අත්සනින් හෝ පෞද්ගලික ලේකම්වරයාගේ අත්සනින් ඉල්ලීම් ලද පසු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිලධාරීන් පත් කරන බවද, අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් සිය තනතුරේ රාජකාරි සිදු කිරීමේදී ඔහු විසින් අත්සන් කරනු ලබන ලිපි ලේඛන සහ යම් අයකුට ලබා දෙන වාචික උපදෙස්, නියෝග අමාත්‍යවරයා නියෝජනය වන බවද පවසයි.

අමාත්‍යවරයා වෙත නිල රාජකාරි සඳහා ලබා දී ඇති සියලු වාහන සඳහා ඉන්ධන ලබා ගත යුත්තේ ඔහුට ලබා දෙන මාසික ඉන්ධන ප්‍රතිපාදන තුලින් බවද, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් අමාත්‍යවරයාගේ කාර්යය මණ්ඩලය වෙත දීර්ඝ කාලීන අවශ්‍යතා සඳහා 2011 වර්ෂයේ සිට 2015 ජනවාරි මස දක්වා එක් එක වර්ෂයට විවිධ ප්‍රමාණයන්ගෙන් වාහන ලබා ගැනීමක් සිදු කර ඇති බව තමා නොදන්නා බවද තම කාලය  කාලය තුල එවැනි වාහන ලබා ගැනීමට වාචික හෝ ලිඛිතව ලබාදී නොමැති බවද, එලෙස සිදු වී තිබෙනම් එය අවිධිමත්ව සිදු වීමක් බවද පවසයි.

අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හෝ සමාගම් වෙතින් වාහන ලබා ගැනීමට තමා වෙත නීත්‍යානුකූල බලයක් පැවති අතර ඊට අමතරව වාහන විෂයට අදාළව බලය පැවරූ නිලධාරීන්ටද එලෙස ලබා ගැනීමට අවකාශ ඇති බවද පවසයි.

මෙලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ලබා ගන්නා ලද වාහන අමාත්‍ය කාර්යය මණ්ඩලය ලෙස නැග වූ අමාත්‍ය කාර්යය මණ්ඩලය නොවන අයවලුන්ට අමාත්‍යවරයා විසින් ලබා දී ඇත්නම් හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ අවශ්‍යතා සඳහා ලබා දී ඇති රජයේ වාහන අමාත්‍ය කාර්යය මණ්ඩලයේ නොවන වෙනත් අය වෙත ලබා දීම නීත්‍යානුකූල නැති බවද එලෙස ලබා දී ඇත්නම් එය ලබා දුන් පුද්ගලයා වගකිව යුතු බවද පවසයි.

04. ඉලන්දාරි දේව දයානන්ද, අංක 07/01, විජය පෙදෙස, තලවතුගොඩ පාර, මාදිවෙල, කෝට්ටේ.

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රවාහන කළමණාකරු වශයෙන් කටයුතු කරන බවත්, තමන්ගේ ප්‍රධානියා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන වන බවත්, මෙම කාලය තුල මෙම තනතුරේ කටයුතු කලේ සමන්ත ලොකුහැන්නදිගේ මහතා වන බවත්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අභ්‍යන්තර විගණන නිලධාරී විසින් විගණනය සිදුකර යොමුකර ඇති වාර්තාව තුල වාහන 40 ක් සඳහන්ව තිබෙන බවත්, එම වාහන 40 තුලින් වාහන 03 ක් සඳහා ඉන්ධනද වාහන 37 ක් සඳහා වාහන කුලිය සමග ඉන්ධන ලබා දීමට අදාලව සිදුවූ ක්‍රියාදාමය සම්බන්ධයෙන් විගණනයේදී ඉදිරිපත්ව ඇති බවත්, මෙම වාහන කුලී පදනම මත ලබා ගැනීම 2011 වර්ෂයේ සිට 2014 වර්ෂයේ දෙසැම්බර් අතර කාලය තුල වරින්වර සිදුව ඇති බවත්, මෙම කාලය තුල මෙම වාහන කුලී පදනම මත ලබා ගැනීම ආරම්භ වන විට ආශු මාරසිංහ මහතා සභාපති වශයෙන් කටයුතු කර ඇති බවත්, පසුව ජගත් පෙරේරා මහතා එම තනතුරේ කටයුතු කර ඇති බවත්, ඉහත වාහන කුලී පදනම මත ලබා ගැනීමට අදාලව සියළු ගිවිසුම් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන සමන්ත ලොකුහැන්නදිගේ මහතාගේ අත්සනින් අත්සන් කර ඇති බවත්, සමහර ගිවිසුම් ඔහුගේ උපදෙස් මත ඔහු කාර්යාලයේ නොමැති අවස්ථා වල තමන් විසින් අත්සන් කර ඇති බවත්, වාහන කුලී පදනම මත ලබා ගැනීමට අදාලව වාහනයේ මිල තීරණය වී ඇත්තේ ප්‍රසම්පාදන කමිටුවෙන් ලබා ගන්නා ලද තීරණයකට අනුව බවත්, උපරිම මිල කාර් රථයක් සඳහා රුපියල් 38,000/- ක් වශයෙන් එහි සඳහන්ව ඇති බවත්, මෙම වාහන කුලී පදනම මත පවරා ගැනීමෙන් පසු සංස්ථාවේ කටයුතු සඳහා යොදා ගෙන ඇති බවටත් වාහන ලබාදෙන ලෙසට ඉල්ලීම් ලිපි ඇතුලත්ව තිබෙන බවත්, නමුත් එලෙස ඉල්ලීම් ලිපි ඇතුලත්ව ඇත්තේ මෙලෙස කුලී පදනම මත පවරාගෙන කාලයක් ගත වීමෙන් පසුව බවත්, එලෙස ලිපි ඇතුලත් කිරීම වාහන ලබාදීම නීත්‍යානුකූල කිරීම සඳහා සිදුකල දෙයක් බවත්, මේ සඳහා මූලික වී කටයුතු කලේ සමන්ත ලොකුහැන්නදිගේ මහතා බවත්, කුලී පදනම මත පවරාගත් වාහන සමන්ත ලොකුහැන්නදිගේ මහතාගේ උපදෙස් මත අමාත්‍ය කාර්යාලය වෙත යොමුකර ඇති බවත්, එලෙස යොමුකර ඇති වාහන ආර්.එම්. දුෂ්මන්ත අබේසිංහ, සම්පත් තිලකරත්න, ජේ.එච්.ආර්. නයනානන්ද, ලාල් කුලරත්න, රිද්ම විමුක්ති කුමාර, ජී.එන්.එස්. මෙන්ඩිස්, ඇමති ආරක්ෂක නිලධාරීන්, යූ.එච්. සුරේෂ් ඉන්දික, බී. උදය ප්‍රියජිව

පෙරේරා, ඉන්නැසන්දේ සද්ධාතිස්ස හිමි, ලලිත් ප්‍රන්සකුමාර, පී.එස්. විජේසිරි, සම්බන්ධීකරණ ති. ජේ. වාහක, පියසිරි විජේනායක, බොල්ලෙන ඉන්දික ගමගේ, ලේකම් විමලසිරි පෙරේරා, ප්‍රසන්න සංජීව කොස්තලෝන්, ආනන්ද අශෝක, ජී.පී. ආනන්ද, සේනක ප්‍රියදර්ශන, නියෝජ්‍ය ඇමති ලසන්ත අලගියවන්න, ප්‍රදීප් විජේසේකර, රංජිත් ගාමිණී විතුමසිංහ, සමන්සිරි හේරත්, ප්‍රියන්ජිත් විතාරණ යන අය විසින් පාවිච්චි කර ඇති බවට අනාවරණය වන බවත්, එම පිරිසගෙන් සමහරක් අමාත්‍ය වරයාගේ ලඟම දෙනීන්ද, ජාතික නිදහස් පෙරමුණේ ක්‍රියාකාරී සාමාජිකයින්ද, නීතා කාර්යාලයේ කාර්ය මණ්ඩලයෙන් පරිත්‍යාගී නිලධාරීන්ද වන බවත්, ඉහත වාහන පාවිච්චි කර ඇති කාල වකවානුවට සාපේක්ෂව බොහෝ පිරිසක් සඳහා නිල වශයෙන් එම තනතුරට වාහනයක් පාවිච්චි කිරීමට නීත්‍යානුකූල හිමිකමක් නොවන පිරිසක් වන බවත්, මෙම වාහන ලබා දීමට අදාලව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් වාහන හිමිකරුවන් වෙත මාසිකව කුලී මුදල් ගෙවා ඇති බවත්, ඉන්ධනද ලබා දීමක් සිදුකර ඇති බවත්, සිදුකර ඇති ගෙවීම් සම්බන්ධයෙන් සහ ලබාදී ඇති ඉන්ධන වලට අදාලව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් දරා ඇති මුදලද, ගිණුම් අංශයෙන් ලබාගත යුතු බවත් සඳහන් වන ලෙස ප්‍රකාශ ලබාදී ඇත.

05. **මාධව හර්ෂන සේනාධීර, නො. 33/10, සමිඳුවත්ත පාර, මාගල්ල, ගාල්ල**

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් වශයෙන් කටයුතු කරන බවත්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත කුලී පදනම මත ලබා ගන්නා ලද වාහන වලට අදාලව වාහනයේ හිමිකරු විසින් අදාල මාසික මුදල ලබා ගැනීමට ඉල්ලුම් කල විට ප්‍රධාන නිලධාරියාගේ සහතික කිරීම මත හා ගෙවීම් නිර්දේශ කිරීම මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන වෙත යොමුවන බවත්, ඔහු විසින් ගෙවීම් අනුමත කර අත්සන් තබමින් තමන් වෙත යොමු කරන බවත්, තමන් විසින් ගණකාධිකාරී ගෙවීම් වෙත යොමු කරන බවත්, ඔහු විසින් ලේඛණ පරීක්ෂා කිරීමෙන් පසු චෙක්පත් අත්සන් කිරීම සඳහා ගණකාධිකාරී වෙත යොමු කරන බවත්, ඊට අදාලව 2010 වර්ෂයේ සිට 2015 ජනවාරි 08 දින දක්වා වාහන සම්බන්ධයෙන් ගෙවන ලද මුදල් සම්බන්ධ ලේඛනයක් ගණකාධිකාරී ගෙවීම් අංශයෙන් ලබාගෙන තමන් සකසා ඇති බවත්, ඒ අනුව අදාල කාලයට අදාලව කුලී පදනම මත පවරාගත් සියළුම වාහන සඳහා එනම් වාහන 49 ක් සඳහා රුපියල් 144,504,855.27 ක මුදලක් මාසික වාහන කුලිය, ඉන්ධන දීමනාව සහ රියදුරු සහ අතිකාල දීමනා වශයෙන් ලබාදී ඇති බවත්, තමාගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට අදාලව මූලික වූ වාහන අංක වලට අදාලව වාහන කුලිය වශයෙන් සහ ඉන්ධන පිරිවැය සම්බන්ධයෙන් වැයවූ මුදල වශයෙන් ගණනය කර ප්‍රකාශයක් පසුව ලබා දීමට කටයුතු කරන බවත් සඳහන් කරමින් ප්‍රකාශයක් ලබාදී ඇත.

06. **චන්ද්‍රජිත් ආශූ බෝධ් මාරසිංහ, නො. 117/36/4/1, ඇල්විටිගල මාවත, කොළඹ 08**

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් විමල් වීරවංශ මහතා අමාත්‍ය ධූරයට පත්වීමෙන් පසු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති වශයෙන් පත්ව 2011 මැයි 25 වන දින දක්වා එම තනතුරේ කටයුතු කල බවත්, තමන් ඉවත් වීමෙන් පසු එම තනතුරට ජගත් පෙරේරා මහතා පත්වූ බවත්, තමන් සභාපති වශයෙන් කටයුතු කල කාලයේ මෙන්ම ඊට පෙර කාල වකවානු තුල මෙන්ම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව තුලට කුලී පදනම මත වාහන ලබා ගැනීම සිදුව තිබූ බවත්, එයට හේතුව සංස්ථාව තුල ප්‍රමාණවත් වාහන සංචිතයක් නොතිබීමේ හේතුව බවත්, සංස්ථාව වෙත වාහන ලබා ගැනීමේ ක්‍රියාවලිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වෙත පවරා දෙමින් නීත්‍යානුකූල රාමුව තුල සිදු කිරීමට බලය ලබාදුන් බවත්, මෙලෙස කුලී පදනම මත ලබාගත් වාහන අතරින් යම් ප්‍රමාණයක් අමාත්‍ය කාර්යාලයට ලබාදීම සිදුකල බවත්, එලෙස ලබාදීම සිදුකලේ අමාත්‍ය වරයාගේ හෝ නියෝජ්‍ය අමාත්‍ය වරයාගේ වාචික හෝ ලිඛිත ඉල්ලීම් වලට බවත්, තමා සභාපති වශයෙන් රාජකාරී සිදුකල කෙටි කාලය තුල අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ වාචික ඉල්ලීමට අනුව වාහන කීපයක් ලබාදීම සිදුකල බවත්, එලෙස අමාත්‍ය වරයා විසින් සිදු කරන ලද වාහන ඉල්ලීම් වලට අනුව වාහන යොමු කිරීම ඔහුගේ පෞද්ගලික ලේකම් වෙත යොමුකල බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

07. **විල්වල ආරච්චිගේ රංජිත් විල්වල ආරච්චි, නො. 11, 04 වන පටුමග, රාජගිරිය.**

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් 2013.03.03 දින සිට ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ හිටපු ඇමති තුමාගේ ඉල්ලීමකට අනුව ජනසේවන අධීක්ෂණ නිලධාරී තනතුරට පත්වී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ 06 වන මහලේ තම කාර්යාලය පවත්වාගෙන ගිය බවත්, ඊට අමතරව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ වරයෙකු වශයෙන්ද පත්වීමක් ලබා කටයුතු කල බවත්,

නිවාස දස ලක්ෂයේ වැඩ සටහන, ගමුදා පුරවර වැඩ සටහන, තම අධීක්ෂණය තුල තිබූ බවත්, ජනතාවගේ පැමිණිලි සම්බන්ධ කඩිනම් ක්‍රියාමාර්ග යෝජනා කිරීම, කොන්ත්‍රාත් කරුවන්ගේ කටයුතු සම්බන්ධයෙන් සොයා බැලීම, නිවාස දස ලක්ෂයේ වැඩ සටහන යටතේ සිදු කරන සියළු වැඩ අධීක්ෂණය කිරීම තම කාර්යයන් අතර වූ බවත්,

මෙම කටයුතු සඳහා වාහන යොදා ගැනීම තමන් වෙත ලබාදී තිබූ වාහන වලින්ද හෝ නිවාස අධිකාරියේ වාහන සංචිතයේ ඇති වාහන වලින් ලබා ගැනීම හෝ අමාත්‍යාංශයේ පෞද්ගලික ලේකම් වරයාගෙන් ඉල්ලාගෙන ලබාදීම සිදුකල බවත්,

අමාත්‍ය වරයා විසින් මෙම අංශය පිහිටුවීම ආරම්භයේදී අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 11 හි සාමාන්‍යාධිකාරී වරුන් කැඳවා ජනසෙවන නිවාස හා ජනාවාස සංවර්ධන වැඩ පිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා උදව් වන ලෙසට දන්වා සිටි බවත්,

තමන් භාරව කටයුතු කල ජනසෙවන ව්‍යාපෘතිය තුල රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් කුලී පදනම මත ලබාගත් වාහන පාවිච්චි කරන ලද නමුදු තමාගෙන් විමසා සිටි කිසිවෙකු රාජකාරී වශයෙන් මැදිහත්වීමක් කිසිසේත් සිදුනොවුනු බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

08. විජේසේකර මුදියන්සේලාගේ අචල උපේන්ද්‍ර ජයතිලක, නො. D/V/2/3/R, වික්ටෝරියා පෙදෙස, කොළඹ 08

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් හිටපු අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ පෞද්ගලික ලේකම් වරයෙකු වශයෙන් විමල් වීරවංශ මහතා ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය ධූරයට පත්වූ මුල් කාලයේ සිට 2011 අග භාගය දක්වා කටයුතු කල බවත්, මෙම කාලය තුල අමාත්‍ය වරයාගේ උපදෙස් මත පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් වාහන ලබා ගැනීමටද ඊට අමතරව අමාත්‍ය වරයාගේ උපදෙස් මත අමාත්‍ය කාර්ය මණ්ඩලයෙන් පරිබාහිර පාක්ෂිකයන් වෙත වාහන ලබා ගැනීමටද මූලික වූ බවත්, අමාත්‍ය වරයාගේ උපදෙසකින් තොරව කිසිදු අවස්ථාවක වාහන ලබා ගැනීමක් තමන් විසින් සිදු නොකල බවද, අමාත්‍ය වරයාගේ පෞද්ගලික ලේකම් වශයෙන් කටයුතු කිරීමෙන් පසු ඔහුගේ උපදේශකයෙකු වශයෙන් වසරකට ආසන්න කාලයක් කටයුතු කර ඇති බවටත්, තමන්ගෙන් පසුව පෞද්ගලික ලේකම් තනතුර සඳහා අමාත්‍ය වරයාගේ සහෝදරයෙකු වන සරත් වීරවංශ මහතා පත්වූ බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

09. විජේසේකර මුදියන්සේලාගේ අචල උපේන්ද්‍ර ජයතිලක, DV2/3/R, වික්ටෝරියා පෙදෙස, කොළඹ 08

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් 2010 අප්‍රේල් මස සිට 2011 මැද භාගය දක්වා ඉදිකිරීම් ඉංජිනේරුසේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය වරයාගේ පෞද්ගලික ලේකම් වරයා වශයෙන් කටයුතු කල බවත්,

2011 වර්ෂයේ වාහන පාවිච්චි කල බවට ලේඛනයේ සඳහන් අය සඳහා වාහන ලබා ගැනීමට මූලික වී කටයුතු නොකල බවත්, අමාත්‍ය වරයා විසින් අමාත්‍යාංශ ලේකම් වරයා විසින් එවැනි ඉල්ලීමක් සිදු කලේද යන්න තමන් නොදන්නා බවත්, නමුත් එම ලිපියේ සඳහන් අමාත්‍ය වරයාගේ ස්ථිර කාර්ය මණ්ඩලයේ වාහන පාවිච්චි කල හැකි තනතුරු දරණ අයගේ වාහන ලබා ගැනීම සඳහා පමණක් යම් මැදිහත් වීමක් සිදුකල බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

10. බටගොඩ සංඝානම්ලාගේ ජගත් කුමාර පෙරේරා, නො. 373 B, වෙදගේ වත්ත පාර, මාගම්මන, හෝමාගම

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් ආශූ මාරසිංහ මහතාගෙන් පසු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති වශයෙන් 2015 ජනවාරි මස දක්වා කටයුතු කල බවත්, මෙම කාලය තුල අමාත්‍ය වරයා වශයෙන් විමල් වීරවංශ මහතා කටයුතු කල බවත්, තමා සභාපති වශයෙන් කටයුතු කල කාලය තුල ඉදිකිරීම් කොන්ත්‍රාත් මිලියන 4000 කට ආසන්න වටිනාකමකින් යුක්තව ලැබුනු බවත්, ඉදිකිරීම් කොන්ත්‍රාත් ලංකාවේ විවිධ ප්‍රදේශ තුල තිබීම මත අධීක්ෂණ කටයුතු සඳහා අමාත්‍යාංශ නිලධාරීන්ට ගමන් කිරීමේ පහසුව සලසා ගැනීමේ අරමුණින් සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන වශයෙන් කටයුතු කල සමන්ත ලොකුහැන්නදිගේ මහතාගෙන් තමන් පැමිණීමට පෙර සිට ලබාගෙන ඇති බවට දැනගත් බවත්, මෙලෙස වාහන ලබාදීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන වල සඳහන් පරිදි නීති ක්‍රමවේද තුල ලබා දීමට කටයුතු කර ඇතැයි තමන් විශ්වාස කල බවත්, ඔහුගේ තනතුරේ වගකීමට වාහන කුලී පදනම මත ලබා ගැනීමේ ක්‍රියාවලියේ වගකීම් පැවරුනු බවත්, තමන් සභාපති ධූරයට පත් වීමෙන් පසු සාමාන්‍යාධිකාරී වරුන් සියළු දෙනා කැඳවා ඔවුන්ගේ රාජකාරී වගකීමට අයත් නොවන යම් ඉල්ලීමකට ක්‍රියා මාර්ග ගැනීමට පෙර ලිඛිතව තමාගෙන් උපදෙස් ලබා ගැනීමට දැනුවත් කල බවද, අමාත්‍ය වරයා විසින් වාහන ඉල්ලා ලිඛිතව හෝ වාචික ඉල්ලීම් තමන් වෙත සිදුකර නොමැති බවත්, එලෙස වාහන ලබා ගැනීමේ සියළු කටයුතු සමන්ත ලොකුහැන්නදිගේ මහතා සමග සම්බන්ධ වී අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් කටයුතු කල බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

11. බැතිගෙල් ගණගරාජා රාජසේකරන්, නො. 93/14, පීටර්සන්කෝව්, පීටර්සන් පාර, කොළඹ 06

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සාමාන්‍යාධිකාරී වශයෙන් දැනට කටයුතු කරන බවත්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව තුල 1994 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ විවිධ තනතුරු හොබවා ඇති බවත්, අමාත්‍යාංශය භාර අමාත්‍ය වරයෙකුට හෝ ඔහුගේ පෞද්ගලික ලේකම් වරයෙකුට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පරිපාලන කටයුතු වලට කිසිදු අධිකාරියක් නොමැති බවත්, යම් අවශ්‍යතාවයක් පවතින්නේ නම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් හරහා ලිඛිතව යොමුකල යුතු බවත්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව තුල වගකීම් ව්‍යුහය අංශ ප්‍රධානීන් සාමාන්‍යාධිකාරී වරයාටද, සාමාන්‍යාධිකාරී වරයා සභාපති වරයාටද වන ලෙස වගකීම් පැවරී තිබෙන බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

12. මද්දුමගේ දොන් පද්මසිරි, නො. 301/06, ස්වර්ණපාය වත්ත, කොලමුන්න, පිළියන්දල

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් 1990 වර්ෂයේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රැකියාව සඳහා පැමිණ 2014 මැයි මාසයේදී පමණ සාමාන්‍යාධිකාරී තනතුරට පත්වී 2015.08.03 වන දින දක්වා එම තනතුරේ කටයුතු කරමින් සිටියදී විශ්‍රාම ලබාගත් බවද,

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ප්‍රධානියා වශයෙන් සාමාන්‍යාධිකාරී තනතුරේ සියළු කටයුතු සඳහා වගකීමෙන් තමා බැඳී සිටින බවත්, ප්‍රවාහන අංශය ඇත්තේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන අංශය යටතේ බවත්, අමාත්‍යාංශය වෙත වාහන මුදා හැරීම සම්ප්‍රදායික ක්‍රමයක් වන බවද, ඒ අනුව අමාත්‍යාංශය වෙත වාහන මුදාහැර තිබෙන බව තමන් දැනසිටියද කිසිත් ලබාදී තිබේද යන්න දැනුවත් නොවුනු බවත්, ඒ පිළිබඳව කටයුතු කළේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන විසින් බවත්,

එම කාලය තුළ සමන්ත ලොකුහැන්නදිගේ කටයුතු කළ බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

13. අගම්පොඩි නිමල් ලෙස්ටන් මෙන්ඩිස්, නො. 87/02 B, දෙනිය වත්ත, කිඹුලගම්මුල්ල, ගම්පහ

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් දැනට තමන් මහජන සම්බන්ධතා නිලධාරියෙකු වශයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සේවයේ යෙදී සිටින බවත්, 2006 වර්ෂයේ සිට වෘත්තීය සමිති සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමේ ලේකම් වරයෙක් වශයෙන් ජනාධිපති ලේකම් වරයාගෙන් පත්වීමක් ලැබ ඒ අනුව තමන් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට අනුයුක්තව කටයුතු කළ බවත්, ඊට අමතරව සහකාර ලේකම් සම්භාරු සබඳතා තනතුරද දැරූ බවත්, හැවන විමල් වීරවංශ ඇමති තුමාගේ කාලය තුළ ජනාධිපති ලේකම් තුමාගේ පත්වීම් ලිපියක් අනුව 2010.10.13 වන දින සිට අමාත්‍යාංශයේ වෘත්තීය සමිති කටයුතු සම්බන්ධීකරණය සඳහා සහකාර ලේකම් තනතුරකට පත්වූ බවත්, මෙම පත්වීම ශ්‍රී ලංකා පරිපාලන සේවයට අයත් නොවන පත්වීමක් බවත්, එම තනතුර සඳහා වාහනයක් ලබා දෙන ලෙසට අමාත්‍ය වරයා වෙත සිදුකල ඉල්ලීමකට අනුව මෙම වාහනය තමන් වෙත ලැබුණු බවත්, මේ සඳහා ඉදිරිපත් කල ඉල්ලීම් ලිපියේ වාහනයක් ලබා දෙන ලෙසට අමාත්‍ය වරයා විසින් සටහනක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති වරයා වෙත යෙදූ බවත්, ඒ අනුව තමන් වෙත ඉන්ධන සමග වාහනයක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ලද බවත් සඳහන් කර ප්‍රකාශයක් ලබාදී ඇත.

14. ඇලපාත විතානගේ සමන් ප්‍රියන්ජිත් විතාරණ, නො. 419, පොල්කණ්ද පාර, ඇලපාත, රත්නපුර

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් දැනට ජාතික නිදහස් පෙරමුණේ ලේකම් වරයා වශයෙන් කටයුතු කරන බවත්, තම පක්ෂය වෙත ජනතා විමුක්ති පෙරමුණෙන් සහ එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් එල්ල වී තිබූ තර්ජන හේතුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ආරක්ෂාව සඳහාත් ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම සඳහාත් ලබාදුන් වාහන අතරින් එක් වාහනයක් තමන් වෙතද ලැබුනු බවත්, 2010 වර්ෂයේදී විමල් වීරවංශ මහතා අමාත්‍ය ධුරයට පත්වීමෙන් පසු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයෙන් ඔහුගේ සංකල්පයකට අනුව ජනසෙවන ව්‍යාපෘතිය ආරම්භ කල බවත්, මේ සඳහා ජාතික නිදහස් පෙරමුණේ ක්‍රියාකාරී සාමාජිකයන් වෙත සහයෝගය ලබා දෙන ලෙසට විමල් වීරවංශ මහතා විසින් ඉල්ලා සිටි බවත්, මේ සඳහා තමන් ජනාධිපති ලේකම් කාර්යාලය වෙතින් ලබාදී තිබූ වාහනය සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ඉන්ධන ලබාගෙන ඉහත ව්‍යාපෘතිය සඳහා සහය ලබාදුන් බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

15. රත්වත්ත මුදියන්සේලාගේ දුෂ්මන්ත අබේසිංහ, නො. 179, පට්ටිවෙල, ගලේවෙල

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් ජාතික නිදහස් පෙරමුණේ පක්ෂ සාමාජිකයෙකු වශයෙන් විමල් වීරවංශ මහතා සමග කටයුතු කරන අතර, ඔහුගේ ආරාධනයකට අනුව තමන් පාර්ලිමේන්තු කටයුතු ලේකම් වශයෙන් පත්වීමක් ලබා 2010.04.21 වන දින සිට කටයුතු කල බවත්, මෙම තනතුරේ රාජකාරි කටයුතු සඳහා වාහනයක අවශ්‍යතාවය ඇතිවූ බැවින් විමල් වීරවංශ මහතා වෙත ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කල බවත්, ඒ අනුව රියදුරෙකු සමග වාහනයක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් තමන් වෙත ලැබුණු බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

16. බාලවඩුගෙදර මහලුලෙදුරිය ජය ශ්‍රී තුෂාර මෙන්ඩිස්, නො. 695, කොරතොට උතුර, කඩුවෙල

යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් ජාතික නිදහස් පෙරමුණේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ලිපිකරුවෙකු වශයෙන් කටයුතු කරමින් සිටියදී විමල් වීරවංශ මහතාගේ ආරාධනයකට අනුව අමාත්‍ය කාර්යාලයේ සේවය සඳහා පැමිණීමට හැකිද යන්න පෞද්ගලික ලේකම් වෛද්‍ය අවල මහතා තමන්ගෙන් විමසා සිටි බවත්, ඒ අනුව 2010.05.11 වන දින වැඩ භාරගෙන නිවාස ණය හා ආධාර වැඩ සටහන ගැන සොයා බැලීම සිදුකල බවත්, ඊට අමතරව වෙනත් කාර්යයන් සඳහා වගකීමක්ද ලබාදී තිබූ බවත්, මෙම කාර්ය සඳහා බස්නාහිර පළාත තුල මෙන්ම පළාතෙන් පිටතද සංචාර සඳහා යෙදුනු බවත්, මේ සඳහා වාහනයකට අවශ්‍යතාවය පැන නැගුනු බවත්, අමාත්‍ය වරයාගේ පෞද්ගලික ලේකම් අවල මහතා දැනුවත් කර ඊට දිනකින් සමන්ත මහතා හමුවන ලෙස දැනුවත් කල බවත්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සමන්ත මහතා හමුවී පසුව ප්‍රවාහන කළමනාකරු වෙත යොමුකල බවත්, සංචිතයේ වාහනයක් නොවුනු බැවින් තමන්ගේ වාහනයක් ඒ සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමග ගිවිසුම් ගතවී එම වාහනය රාජකාරි පැමිණීම හා පිටවීම සඳහාත් යොදාගත් බවත්, රියදුරු වශයෙන් තමන්ම කටයුතු කල බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

17. පල්ලෙපෙරුව ගමගේ ආනන්ද ප්‍රියදර්ශන, නො. 84/01, එක්සත්ගෙදර පාර, මහරගම
යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් විමල් වීරවංශ මහතාගේ නෑයෙකු වන නිලංගී වීරවංශ සමඟ විවාහ වී සිටින බවත්, 2013.08.28 වන දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ගබඩා භාරකරු වශයෙන් පත්වීමක් ලබා පැමිණි බවද, මෙම පත්වීමට අදාළව ලිඛිත අයදුම් කර ඇත්තේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් හා පාලන සම්පත් ලොකුහැන්නදිගේ බවත්, මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත ලබාදුන් බවත්, තම තනතුර සඳහා වාහනයක් අවශ්‍ය බව විමල් වීරවංශ මහතා වෙත හා පෞද්ගලික ලේකම් සරත් වීරවංශ මහතා වෙත කල ඉල්ලීමක් අනුව මෙම වාහනය ලබාදුන් බවත්, එහි රියදුරු වශයෙන් අජන්ත යන අය කටයුතු කල බවත්, මෙම වාහනය තම පෞද්ගලික කටයුතු මෙන්ම රාජකාරී කටයුතු සඳහාද භාවිතා කල බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

18. ජෙදුරු ආරච්චිගේ සරත් විජේසිරි, නො. 156/01, මාලම්මන, හෝමාගම
යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තම ජනතා විමුක්ති පෙරමුණේ ලේකම් වරයෙකු වශයෙන් 1995 වර්ෂයේ සිට වැඩ කරමින් පුත්තලම් දිස්ත්‍රික්කයේ 1998 වර්ෂය දක්වාත්, 1998 වර්ෂයේ සිට 2000 වර්ෂයේ පෙබරවාරි දක්වා පොළොන්නරුව දිස්ත්‍රික්කයේත් 2008 වර්ෂය දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේත් ඉහත තනතුරේ වැඩ කල බවත්, තමාගේ බිරිඳ ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරී සාමාජිකාවක් වශයෙන් කටයුතු කල බවත්, ඇගේ නම ප්‍රියංකා මැණිකේ කොහොලාවල වන බවත්, ඇය 2011 වර්ෂයේ මැද භාගයේදී පැවති ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඡන්දය ඉල්ලා හෝමාගම ප්‍රාදේශීය සභාවට තේරී පත්වූ බවත්, නිවාස සංවර්ධන අධිකාරියේ තමා වෙත තනතුරක් ලබාදී නොතිබූ බවත්, තමා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාහන කිසිවක් පාවිච්චි නොකල බවත් සඳහන් කරමින් ප්‍රකාශයක් ලබාදී ඇත.

19. ලියනගේ චන්ද්‍රන කුමාර නො. 72/C/1, සරණපාල හිමි මාවත, මාවතගම, පාදුක්ක.
2010 වර්ෂයේ සිට ක්‍රියාකාරී දේශපාලනයට සම්බන්ධ වී එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් සීතාවක ප්‍රාදේශීය සභාවට සභිකයෙක් වශයෙන් තේරීපත් වූ බවත් ජන සෙවන වැඩ සටහනේ ව්‍යාපෘති සම්බන්ධීකාරක තනතුරක් එම වැඩ සටහනේ සම්බන්ධීකරණ ලේකම් රංජිත් විල්ලව ආරච්චි මහතා විසින් ලබා දුන් බවත් මෙම කාර්යයන් සඳහා වාහනයක් අවශ්‍ය බව රංජිත් විල්ලව ආරච්චි මහතා වෙත දැනුම් දීමෙන් පසු වාහනයක් සොයා ගන්නා ලෙස හා එම වාහනයට අවශ්‍ය කරන මුදල් ලබා දෙන බව පැවසූ හෙයින් තමාට අයත් වාහනය වන අංක 54-5678 දරණ නිසාන් වැනට් වෑන් රථය මේ සඳහා යොදා ගත් බවද, රංජිත් මහතා ගේ උපදෙස් පරිදි රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගොස් එහි මානව සම්පත් කළමනාකරණ සම්පත් ලොකුහැන්නදිගේ මහතා හමු වී මේ සම්බන්ධව දැනුම් දුන් බවද පවසයි.

ඒ අනුවසම්පත් ලොකු හැන්නදිගේ මහතා ඉදිරිපිට ගිවිසුම් අත්සන් කල බවද, 2013.07.01 දින සිට 2014 ඔක්තෝම්බර් මාසය වන තෙක් මෙම වාහනය සඳහා ගිවිසුමට අනුව සංස්ථාවෙන් මාසික කුලිය ලබා ගත් බවද පවසයි. H.G. තුවන් සමීර, නො.33/16, වැලිකඩ පාර, රාජගිරිය යන අය රියදුරු ලෙස කටයුතු කල බවද පවසයි.

20. මුතු කොට්ට ගමගේ නලින් වසන්ත කුමාර ස්ථිර රියදුරු, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉසුරුපායේ වැඩබිම නො. 187/1/ඒ, රම්‍ය මාවත, කලපලුවාව, රාජගිරිය.
හිටපු අමාත්‍ය විමල් වීරවංශ මහතාගෙන් තමා විසින් කරන ලද ඉල්ලීමක් පරිදි 2011.09.23, කොන්ත්‍රාත් පදනම මත රියදුරු රැකියාවක් ලබා ගත් බවත් 2014 වර්ෂයේ ස්ථිර රියදුරෙකු ලෙස පත්වූ බවත් පවසයි. ඉන් පසුව ප්‍රවාහන අංශයේ දයානන්ද මහතා හා සම්පත් මහතා ගේ උපදෙස් මත අමාත්‍යාංශයට ගොස් විමල් වීරවංශ මහතාගේ සම්බන්ධීකරණ ලේකම් රංජිත් විඳුම්සිංහ මහතා විසින් ලබාදුන් අංක JN-9942 කාර් රථයේ සේවය කල බවත් පවසා සිටී. ධාවන සටහන් පත් රියදුරු චමිල විසින් සකස් කර ඇති බව පවසයි. මීට අමතරව අංක GJ-4501, KA-6932, GJ-4501 වාහන පාවිච්චිකල බවද ඉන් සමහරක ධාවන සටහන් තමා අත්සන් කල බවද පවසා ඇත.

විමුක්ති වීරවංශ මහතා විසින් පාවිච්චි කරන ලද අංක GQ-4894 වාහනයට ඉන්ධන සපයා දෙන ලෙස කරන ලද ඉල්ලීම අනුව තමා විසින්ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගොස් වාහනය සඳහා ඉන්ධන ලබා ගෙන තිබෙන බවත් එසේම මීස් යන අය විසින් විසින් පැදවූ අංක JR-5353 වාහනය හා 300-5690 වාහනයේ ධාවන සටහන් පලු චමිල, ධම්මික ජෝම චන්ද, අජන්ත චන්ද්‍රනාත් යන සංස්ථා රියදුරන් සකස් කල බවත් පවසා ඇත.

21. විතානගේ දොන් ප්‍රියන්ජිත් චමිල් සංස්ථා ස්ථිර රියදුරු, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ප්‍රධාන කාර්යාලය, නො .84/3, මයිකොන්තා වත්ත, කැකුලන්දල, අගලවත්ත
2008.01.16 දින කොන්ත්‍රාත් පදනම මත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට සේවයට එක් වී 2014. ඔක්තෝම්බර් මාසයේදී ස්ථිර සේවකයෙකු බවට පත්ව ඇත. විමල් වීරවංශ මහතා නිවාස ඉදිකිරීම ඉංජිනේරු සේවා පොදු පහසුකම් ඇමති වශයෙන් පත් වූ පසු දයානන්ද මහතාගේ උපදෙස් පරිදි අංක GD-4538 වාහනය අමාත්‍යාංශයට රැගෙන ගොස් විමල් වීරවංශ මහතාගේ පුද්ගලික ලේකම් වෛද්‍ය

අවල මහතා හදුන්වාදුන් විමල් වීරවංශ ඇමතිතුමාගේ පාර්ලිමේන්තු කටයුතු ලේකම් දුම්මින්ද අබේසිංහ මහතා වෙත සේවය කළ බවද පවසයි.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අයත් අංක GD-4538 වාහනය මාස 06 ක් පමණ ධාවනය කර අනතුරක් හේතුවෙන් අලුත්වැඩියාවට යොමුකර දුම්මින්ද මහතාගේ මිතුරකු වූ සුවන් ඉන්දික මහතාගෙන් වාහනයක් ලබාගෙන සංස්ථාවට කුලී පදනම මත යෙදවීමට දුම්මින්ද මහතා ක්‍රියා කළ බවද, මෙසේ අංක KE-0231, KR-7730, KA-8125, KS-7735 වාහන පාවිච්චි පාවිච්චි කල බවද පවසයි. අංක KR-7730 වාහනය වැඩිපුර පාවිච්චි කල බවත් පවසන අතර අංක රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සම්බන්ධීකරණ නිලධාරී නයනානන්ද මහතා විසින් පාවිච්චි කළ අංක CAB-9727 වාහනය සඳහා අමාත්‍යාංශයේ සිට සංස්ථාවට රැගෙන ගොස් ඉන්ධන කිහිප වාරයක් ලබා ගෙන තිබෙන බවත් එම වාහනයේ රියදුරු සම්පත් තිසේරා බවද පවසයි. ඊට අමතරව සම්බන්ධීකරණ ලේකම් ඉන්දික ගමගේ මහතා විසින් පාවිච්චි කළ අංක PC-9097 වාහනය සඳහා ඉන්ධන සංස්ථාවෙන් ලබා ගෙන ඇති බවද පවසයි.

22. **ගෝනදෙණියේ ප්‍රදීප් චන්ද්‍ර කුමාර ප්‍රනාන්දු ස්ථිර රියදුරු, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව නො. 190, පිටිදෙණිගම, පරණ, කොළොන්නාව.**
2012 වර්ෂයේ II වන මාසයේ පමණ කොන්ත්‍රාත් පදනම මත ඉංජිනේරු සංස්ථාවට සේවයට බැදී වෛද්‍ය අවල මහතා හමු වීමෙන් පසු අමාත්‍යාංශයේ වාහනයක සේවය කල බව පවසන අතර අංකය මතක නැති බව පවසයි.

2013 ජනවාරි මාසයේදී තමා සුරේෂ් ඉන්දික මහතා යටතේ රියදුරු වශයෙන් කටයුතු කල බවද අංක KU- 9867 පැජිරෝ මොඩලෝ වර්ගයේ ජීප් රථයේ ධාවන සටහන් පත් තමා විසින් සකස් කර ඇති බවදපවසන අතර එම වාහනයට පෙර වාහන කීපයක් පාවිච්චි කර ඇති නමුත් එම වාහන වල අංක මතක නැති බව පවසයි. තමා වික දවසක් සුරේෂ් මහතාගේ රියදුරු කාර්යයෙන් බැහැරව සිටි බවත් එම දිනවල R.A.K.P.L. ද සිල්වා යන රියදුරු වශයෙන් කටයුතු කල බවද පවසයි.

23. **අජන්ත අබේසූරිය උඩගෙදර ස්ථිර රියදුරු, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, නො.58, කවටයාමුන, පලාපත්වල, මාතලේ.**
නො. 12/82, සංඝපාල බෞද්ධ මධ්‍යස්ථානය, කළපළුවාව, රාජගිරිය ලිපිනයේ පදිංචි ඉත්තෑකන්දේ සාමුදුරුවන් ලග රැකියාවකට පැමිණි බවත්, සාමුදුරුවන්ගේ දැනුම් දීම මත ඉංජිනේරු සංස්ථාවේ රැකියාවක් සඳහා ඉල්ලුම් කල බවත් පවසා සිටියි. 2011.05.09 දින තමා කොන්ත්‍රාත් පදනම මත රියදුරෙකු වශයෙන් බඳවා ගැනීමෙන් පසු ඉත්තෑකන්දේ සද්ධාතිස්ස හිමියන් ලග සේවයට යන ලෙස මානව සම්පත් හා පාලන රංජිත් එදිරිසිංහ මහතා පැවසූ බවත් පවසා සිටියි. අංක JI 7117 දරණ නිසාන් වර්ගයේ ජීප් රථය පැදවූ බවත්, ඉත්තෑකන්දේ සාමුදුරුවන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හා [illegible] [illegible] ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි බවත්, ඉන්ධන ලබා ගැනීමට අවශ්‍ය වූ විට සාමුදුරුවන්ගේ දැනුම් දීම මත ඉන්ධන ලබාගැනීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට යන බවත්, ප්‍රවාහන අංශයට ගොස් ප්‍රවාහන අංශයේ ජයලත් මහතා, ප්‍රසාද් මහතා හෝ ප්‍රදීප් මහතා සමග ගොස් ඉන්ධන ලබා ගන්නා බවද පවසයි. වාර කීපයක් වාහන මාරු කල බවත් HO-6514, JS-9725, HN-2194, PD-2563, CAC-3327 වාහන මාරුවෙන් මාරුවට පාවිච්චි කල බවද, වාහන වල රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමග ගිවිසුම් අයිතිකාරිය වන R.G. ප්‍රියංගනී ගුණවර්ධන යන අය සාමුදුරුවන්ගේ නිතවතෙක්ද, ඥාතියෙක්ද, යන්න තමා දන්නේ නැති බවද පවසා ඇත. රාජකාරිය හිමි වන වෙනත් සංස්ථාව මගින් කුලියට ලබා ගෙන සාමුදුරුවන්ට දුන් වාහනය ධාවනය කල බවද වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

24. **ගුණවර්ධනගේ ලාල් ගුණවර්ධන ස්ථිර රියදුරු, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ප්‍රධාන කාර්යාලයනො. 376, මුහසිංහ ගම, මාගම්මන හෝමාගම.**
2010.07.21 දින මා හට කොන්ත්‍රාත් පදනම මත රියදුරු රැකියාව ලැබුනබවත් මා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අංක 61-5125 දරණ නිසාන් පැට්‍රල් ජීප් රථය පැදවූ බවත් පවසයි. ක්‍රියාකාරී අධ්‍යක්ෂක ඇහැලපිටිය මහතා හා මානව සම්පත් කළමනාකාර අබේසේකර මහතා විසින් ලබාදුන් උපදෙස් පරිදි වාහනයත් රැගෙන අමාත්‍යාංශයේ රාජකාරී සඳහා අමාත්‍යාංශයට ගොස් අවල මහතාට වාර්තා කළ බවද ඉන් පසු තමා අමාත්‍යාංශයේ සංචිතයේ හා ධම්පාල යන අයට සේවය කල බව පවසයි.

අංක 61-5125 වාහනය සතුනෙන් සෙවනට වැඩ සටහනේ කාර්යයන් සඳහා යොදවා ගත් බවද 2012 මැයි මාසයේ පමණ නැවත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රාජකාරී සඳහා පැමිණි නමුත් වාහනය රැගෙන ආවේ නැති බවද පවසයි.

25. **හතමුනගේ නිහාල් පුෂ්ප කුමාර ස්ථිර රියදුරු, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ප්‍රධාන කාර්යාලය නො.158/2, මාගම්මන, හෝමාගම.**
නිවාස ඉදිකිරීම් ඉංජිනේරු සේවා හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් අතුල මහතා හමු වීමෙන් පසු 2011 මැද භාගයේ පමණ පත්වීමක් ලැබුනු බවත්, ඒ අනුව අමාත්‍යාංශයේ ප්‍රවාහන සංචිතයට අනුයුක්තව රාජකාරී කළ බවද, මාස දෙකකට පමණ පසු දම්පාල හෙවත් ධර්මපාල මහතා යටතේ

වාහනය පැදවූ බවත් ප්‍රකාශ කරයි. ඔහු සම්බන්ධීකරණ ලේකම් වරයෙක් බවත් මහතයේ සැටියට වාහන අංක HR- 7619 , HN-4098, 65-2643 දරණ වාහන පාවිච්චි කළ බවද පවසා ඇත.

අංක HN- 4098, කාර් රථයේ ධාවන සටහන් පොත තමා විසින් ලියා ඇති බවද, එම වාහනය පාවිච්චි කළ අය වශයෙන් දම්පාල මහතා අත්සන් කර ඇත.

26. **ජයවර්ධන මුදියන්සේලාගේ ඉන්දික මහේෂ් සමරත්න ස්ථිර රියදුරු, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ප්‍රධාන කාර්යාලය නො.40/13/A, කෝස්ගම**
නිවාස ඉදිකිරීම් ඉංජිනේරු පොදු පහසුකම් අමාත්‍යාංශයේ මිතුරකු වන මෙහිඩිස් මයින් අමාත්‍යාංශයේ රියදුරු ඇබෑර්තු තිබෙන බව දැන ගැනීමෙන් පසු ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර කර කොන්ත්‍රාත් පදනම මත රියදුරු රැකියාවක් 2010.12.13 ලබාගත් බවත් මානව සම්පත් හා පාලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි රංජිත් එදිරිසිංහ මහතා පත්වීම් ලිපිය ලබාදුන් බවත් පවසයි.

2011.12.03 වන තෙක් ඒකල පොරකව් අංගන වැඩබිමේ බර වාහන රියදුරකු වශයෙන් සේවය කළ බවත් පවසයි. 2011.12.01 දින සිට ජන සෙවන වසෙනිය සඳහා අනුයුක්ත කර අමාත්‍යාංශය වෙත වාර්තා කරන ලෙස දැන්වූ බැවින්, එම රාජකාරිය සඳහා වාර්තාකළ බව පවසා සිටින අතර, ඉංජිනේරු සංස්ථාවෙන් කුලියට ගන්නා ලද අංක JN-5767 දරණ හෝන්ඩා වර්ගයේ වෑන් රථය ධාවනය කළ බවත් නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ මාධ්‍ය කණ්ඩායම් රැගෙන යාම, අමාත්‍ය කාර්යය මණ්ඩලයේ අය රැගෙන යාම සිදුකල බවත් පවසයි. අංක JN-5767 වාහනයෙන් පසුව අංක KK-3081, 64-3225, HA-2189, KA-4685 වාහන මාරු වෙන් මාරුවට පාවිච්චි කර ඇති බව පවසයි. එම ධාවන සටහන් JN-5767 වාහනයට හා 64-3225 වාහන සඳහා ධාවන සටහන් පොත තමා විසින් සකස් කරන ලද බවද පවසයි.

ධාවන සටහන් පොත ඒකල වැඩ බිමේ රාජකාරි කල ලෙස සකස් කිරීමට සමන්ත මහතා උපදෙස් දුන් බවද ධාවන සටහන් පොත වල පෞද්ගලිකව පාවිච්චි කළ අයගේ අත්සන නොගන්නා ලෙස සමන්ත මහතා උපදෙස් දුන් බවද, මාසය අවසානයේ අමාත්‍යාංශයට දුන් විට අත්සන් කරදේවි යැයි ඔහු පැවසූ බවද පවසා ඇත.

27. **කිරිපැද්දමානගේ රවින්ද්‍ර කුමාර ස්ථිර රියදුරු, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ප්‍රධාන කාර්යාලයෙනො. 133/03, විශ්වකලාව පාර, මාම්පේ, පිලියන්දල.**
රැකියාවක් ලබා දෙන ලෙස මහජන දිනයේදී ඇමති විමල් වීරවංශ මහතාගෙන් කරන ලද ඉල්ලීම පරිදි 2012.10.02 දින කොන්ත්‍රාත් පදනම මත පත්වීමක් ලද බවද ප්‍රධාන කාර්යාලයට අනුයුක්තව සිටියදී දිනක් ප්‍රවාහන අංශයෙන් දැනුම් දුන් පරිදි KL-0812 ඇලියොන් වර්ගයේ කාර් රථයෙන් අමාත්‍යාංශයේ ලේකම් විමලසිරි පෙරේරා මහතාගේ බිරිඳ බත්තරමුල්ල ප්‍රදේශයෙන් කාර් රථයට නංවාගෙන අතුරුගිරිය ප්‍රදේශයේ පිහිටි නිවසට රැගෙන ගිය බවද, පසුදින ඉංජිනේරු සංස්ථාවෙන් දැනුම් දුන් පරිදි වාහනය රැගෙන ඉංජිනේරු සංස්ථාවට ගොස් වාහනය භාර දුන් බවත් ඉන් පසු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාහන සංචිත රියදුරු වශයෙන් කටයුතු කල බවද පවසයි.

28. **අමරකෝන් විදාන පතිරන අමල් චතුරංග, ස්ථිර රියදුරු, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ප්‍රධාන කාර්යාලය. නො. 146/3, දිනෙතිම, පලවින්න, නාකුලුගමුව.**
රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි හැටියට ලෙස කටයුතු කල නිමල් පෙරේරාගේ දැනුම් දීම අනුව ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර 2005 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත රැකියාවක් ලබා ගත් බවත් ප්‍රධාන කාර්යාලයේ රියදුරු සංචිතයේ රාජකාරි කල බවත් පවසයි.

එම කාලය තුලදී ලංකාදීප මාධ්‍යවේදී සංජීව ෆොන්සේකා මහතා සඳහා ගත් බවත් එම මහතාගේ ඉල්ලීම පරිදි ගණකාධිකරණ අංශයෙන් ලබා ගන්නා ලද චෙක්පත් චෙක්පත් භාර ගැනීමේ පොතෙහි අත්සන් කර රැගෙන ගොස් සංජීව ෆොන්සේකා මහතාට ලබාදුන් බවත්, වාහනයේ අංකය හෝ ධාවන සටහන් පත් සකස් කිරීම පිළිබඳ තමා නොදන්නා බවද ප්‍රකාශ කර ඇත.

29. **බේවිට් පතිරණගේ ප්‍රේමසිරි ජයලත් ස්ථිර රියදුරු, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ප්‍රධාන කාර්යාලය නො.306/4, ගල්පාත, රුවන්වැල්ල.**
1997.08.08 දින අනියම් සේවකයෙක් වශයෙන් රැකියාව ලැබුණ බවත්, 2005 වර්ෂයේදී ස්ථිර රියදුරු වශයෙන් සේවයට එක් වූ බවද පවසයි.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මානව සම්පත් හා පාලන වශයෙන් කටයුතු කල කලම්බතාරග ප්‍රනාන්දු ගනතුර දැරූ රංජිත් එදිරිසිංහ මහතාගේ පාවිච්චියට භාර දී තිබූ අංක JZ 2669 කාර් රථයේ රියදුරු වශයෙන් සේවය කළ බවද,

ඉන් පසු ප්‍රවාහන අංශයේ දයානන්ද මහතා ගේ උපදෙස් පරිදි අංක KL-0812 වාහනය භාර ගෙන නිවාස ඉදිකිරීම් ඉංජිනේරු සේවා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විමලසිරි පෙරේරා මහතාගේ නිවසේ ඔහුගේ බිරිඳගේ හා දරුවන්ගේ පෞද්ගලික කටයුතු කිරීම සඳහා අනුයුක්ත කල බවත්, එම ධාවන සටහන් පොත වලින් කොටසක් තමා විසින් සකස් කර ඇති බවද පවසයි.

30. සේවික ලොකුගේ අජන්ත චන්දනගේ ස්ථිර රියදුරු, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, නො.352/5, රාජසිංහ මාවත, ඉහල කරගහමුන, කඩවත.
2012 ජුනි මාසයේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ රියදුරු රැකියාවක් කොන්ත්‍රාත් පදනම මත වෛද්‍ය අචල මහතාගේ දැන හැඳුනුම්කම මත ලබාගත් බව පවසා සිටින අතර, අචල මහතා භාරයේ තිබූ අංක HC-2048 නිසාන් වර්ගයේ සුදු පැහැති කාර් රථයේ රියදුරු වශයෙන් කටයුතු කළ බවත්, 2013 ජුනි පමණ ඒ මහතා විදේශ ගත වීමෙන් අනතුරුව අමාත්‍ය වරයාගේ නිවසේ රියදුරුකු වශයෙන් සේවය කළ බවත් 2015.01.08 පැවති ජනාධිපතිවරණයෙන් පසු නැවත සංස්ථාවට පැමිණි බවත් පවසයි.

31. වෙලේ සංඝසාමිලාගේ ප්‍රසාද් මංජු නො. 21 D, සිරිමල් මාවත, කොහුවල, නුගේගොඩ
යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් 2010 වර්ෂයේ සිට ඛනිජතෙල් කර්මාන්ත ඇමති සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ මාධ්‍ය ලේකම් වරයෙකු වශයෙන් කටයුතු කරමින් සිටියදී විමල් වීරවංශ මහතාගෙන් ලද ආරාධනයකට අනුව ඔහුගේ නිල කාර්ය මණ්ඩලයේ මාධ්‍ය ලේකම් තනතුර 2011.02.01 දින සිට දැරූ බවත්, එදින සිට 2015 ජනවාරි මස දක්වා මෙම තනතුරේ කටයුතු කරමින් මාසික වැටුප වශයෙන් රුපියල් 22,500/- ක මුදලක්ද ප්‍රවාහන දීමනාව වශයෙන් රුපියල් 30,000/- ක මුදලක්ද ඉන්ධන දීමනාව වශයෙන් රුපියල් 30,000/- ක මුදලක් මසකට අනුව ලබාගත් බවත්, ඒ අනුව 2011.02.01 දින සිට ඉන්ධන දීමනාව වශයෙන් රුපියල් 1,526,369.30 ක්ද ප්‍රවාහන දීමනාව වශයෙන් රුපියල් 1,655,599.08 ක මුදලක්ද ලබාගත් බවත්, ඊට අමතරව තමන් වෙත අයත් වූ JY 0359 කාර් රථය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට කුලී පදනම මත ලබාදී මාසික කුලිය වශයෙන් රුපියල් 38,000/- ක දීමනාවක් ගිවිසුමට අනුව ලබාගත් බවත්, මෙම වාහනය 2011.02.01 දින සිට 2012.08.01 දින දක්වා ලබාදී ඉන් පසුව 2015.01.08 දින සිට 250-4715 දරණ ඇසත 15 වෑන් රථය ඉහත කුලී මුදලට ලබාදීම සිදුකළ බවත්, මෙම වාහන 02 සහ වෙනත් වාහන තමා හදිසියට මාධ්‍ය ඒකකයේ වැඩ කටයුතු සඳහා ලබාගත් බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

32. වලිච්චේරු ගේවාගේ ශ්‍රීමන්ත ප්‍රදීප් සිල්වා විජේසේකර, ශ්‍රී සුමිත් පාර, කුඩා වත්තල, වත්තල
යන අය ප්‍රකාශයක් ලබා දෙමින් තමන් වෙත අමාත්‍ය විමල් වීරවංශ මහතා විසින් සම්බන්ධීකරණ ලේකම් තනතුරක් ලබා දුන් බවත්, මෙහිදී තම කාර්ය වූයේ අමාත්‍ය වරයා සහභාගී වන නිල උත්සව සඳහා ඊට පෙර ගොස් සංවිධාන කටයුතු වාර්තා කිරීම බවත්, මේ සඳහා අමාත්‍යංශය වෙතින් වාහනයක් ලබාදුන් බවත්, ලබා දුන් වාහනය දෝෂ සහිත නිසා එම වාහනය නැවත ලබාදී 2011 සිට 2015 දක්වා වාහන දීමනාව සහ ඉන්ධන දීමනාව ලබාගත් බවත්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ලබාදුන් වාහනය රැකියාවේ කටයුතු සඳහාත් පෞද්ගලික කටයුතු සඳහා යොදවා ගත් බවත් සඳහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

<u>සැකකරුවන්ගේ ප්‍රකාශ</u>

01. විමල් වීරවංශ නො. 74 නව මංගල මාවත, හෝකන්දර දකුණ, හෝකන්දර

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත වාහන ලබා ගැනීමට මූලික වූ කරුණු පිළිබඳව බලපෑ විශේෂ හේතු තමාගේ මතකයේ නැති බවද, මිලියන 5000 කට වැඩි වටිනාකමකින් යුත් ව්‍යාපෘති ඒ වන විටත් අමාත්‍යංශය මගින් සිදුකරනු ලැබූ බැවින් මේවායේ ප්‍රගතිය උසස් මට්ටමක පවත්වාගෙන යාම සඳහාත් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ මෙන්ම ඒ වෙනුවෙන් සහය දැක්වූවන්ගේ දායකත්වය හොඳ ගනුදෙනු බැවින් අවශ්‍යතාවයක් වෙනුවෙන් වාහන ලබා ගන්නා වන්නට පුළුවන් බවද, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා දීර්ඝ කාලීන පදනම මත අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත වාහන ලබාගත් බවට පූර්ණ අවබෝධයක් තමා සතුව නැති බවද, එසේ වී තිබෙන්නේ නම් එය විය හැක්කේ පූර්වාදර්ශයකට අනුව අමාත්‍ය වරයාගේ කාර්ය මණ්ඩලය හා වෙනත් සහයෝගය දක්වන්නන්ගේ අවශ්‍යතා සඳහා පෙර සිටිය අමාත්‍යවරු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් වාහන අවශ්‍යතාවය ගත් පරිදි තමාද ක්‍රියා කර ඇති බැවින් බවත් පවසයි.

සංවර්ධන ව්‍යාපෘති සඳහා දායකත්වය ලබාගත් රජයේ නිලධාරීන් නොවන ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ පුද්ගලයින් සඳහා රජයේ වියදමින් වාහන ලබා දීමට අදාලව ලිඛිත අනුමැතියක් මහා භාණ්ඩාගාර ලේකම් වරයාගෙන් ලබා ගැනීමට කටයුතු කර නොමැති බවත්, තීරණ ගනු ලබන්නේ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී බවත්, තමා ලබාදෙන්නේ උපදෙසක් පමණක් වන බැවින් එම උපදෙස් නීතියට අනුකූල වන ආකාරයට ක්‍රියාවට නැංවීම නිලධාරීන් සතු වගකීම වන බවද පවසයි. විමුක්ති හා ලලිත් පුෂ්පකුමාර යන දෙදෙනා ස්වේච්ඡාවෙන් විවිධ වැඩ කටයුතු සාර්ථක කිරීම සඳහා දායක වූ බව දන්නා බවද, ආනන්ද නමින් දෙදෙනෙකු හඳුන්වා ඇත්තේ බිරිඳගේ අක්කාගේ මහත්තයා සහ නංගීගේ මහත්තයා යන දෙදෙනාය. මෙම අය ඉහත ආයතන තුල හෝ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ තනතුරු දැරූ තමුන් වාහන ලබාදීම සම්බන්ධව තමා නොදන්නා බවද,

වෛද්‍ය අචල මහතා තනතුර නොදරන කාලයේදී අදාල වාහනය පාවිච්චි කිරීම සම්බන්ධව තමා නොදන්නා බවද, වාහන පාවිච්චි කර ඇති ප්‍රසාද් මංජු සහ ලුවන් ඉන්දික යන අය පක්ෂයේ සාමාජිකයන් නොවන බවද ජාතික නිදහස් පෙරමුණේ පුත්තලම් දිස්ත්‍රික් සංවිධායක සමන්සිරි හේරත්

මහතා වෙත ඔහු විසින් පදවන ලද PE 3072 වාහනය සදහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉන්ධන ලබා දීමක් පිළිබඳව තමා නොදන්නා බවද,තිලකී වීරවංශ යනු තමාගේ බාල සහෝදරියබවත් අමාත්‍ය කාර්ය මණ්ඩලයේ වැඩ කටයුතු සදහා ඇය සතුව වූ ඇය වෙතවාහනයක් ලබාදී තිබූ බව තමා නොදන්නා බවද පවසයි.

ජනාධිපති ලේකම් වරයා විසින් අමාත්‍යාංශයේ වෘත්තීය සමිති කටයුතු පිළිබඳ නියෝජිතයෙකු වශයෙන් මෙන්ඩිස් මහතා පත් කරන ලද බවත්, එම පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඔහුට වාහනයක් ලබා ගැනීමට හැකිවූ බවක් මතකයේ තිබෙන බවද, මෙන්ඩිස් මහතා පවසන පරිදි තමා විසින් වාහනයක් ලබා දෙන ලෙසට ලිඛිත සටහන් තැබීමක් සිදු කල බවට මතකයක් නොමැති බවද, ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ඇතැම් කටයුතු අඩාල වීමට හේතු විමසීමේදී වාහන පිළිබඳ ප්‍රශ්න ඉදිරිපත් කෙරුණු විට ප්‍රතිපත්තිමය වශයෙන් ගනුලැබූ පියවර පිළිබඳව තමා විසින් මග පෙන්වීම කර ඇතත් අනවශ්‍ය පුද්ගලයන්ට අනවශ්‍ය වාහන ලබා ගැනීමක් හෝ ලබාදීමක් හෝ සම්බන්ධයෙන් තමා දැනුවත් වී නොමැති බවද, වාහන සංචිතයට ලබාදී ඇති වාහන අතරින් KG 6810, GD 7251, JV 5351 දරණ වාහන පිළිවෙලින් රොජර් සෙනෙවිරත්න, සුජිත් මුතුකුමාරණ, වසන්ත බණ්ඩාර යන අයවලුන් වෙත ලබාදීමට මහා භාණ්ඩාගාර ලේකම්ගේ ලබා නොගත් බවද අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ කාර්ය මණ්ඩලය සදහා කුලී වාහන සැපයීම මැයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් 2010.03.10 වන දින යොමු කර ඇති ලිපියේ ඇමුණුම වශයෙන් සදහන්ව ඇති වාහන ලේඛනයේ ඇතුලත්ව ඇති නම් අතරින් මෛද්‍රා අචල, රංජිත් එදිරිසිංහ, ප්‍රසාද් මංජු, ලුවන් ඉන්දික, රුවන් නයනානන්ද, විරාජ් සංජීව යන අය පෞද්ගලික කාර්ය මණ්ඩලයට හෝ රට සම්බන්ධව කටයුතු කල අය බවත් පවසයි. අමාත්‍යාංශයට අයත් නිවාස 02 ක් තිබූ බැවින් ඉන් තමා වෙනුවෙන් වෙන්ව ඇති නිවස ප්‍රයෝජනයට ගැනීමට තමාගේ පෞද්ගලික ලේකම් වරයාට අවස්ථාව සලසා දී ඇති බවද සදහන් වන ලෙස ප්‍රකාශයක් ලබාදී ඇත.

02. සමන්ත ප්‍රියනාත් ලොකුහැන්නදිගේ අංක 66 ,මාරකොල්ලිය , තංගල්ල

2011.05.25 වන දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේමානව සම්පත් කළමනාකරු හා වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වශයෙන් පත්වූ බව පවසන අතර, ප්‍රමාණවත් වාහන සංචිතයක් නොතිබූ බැවින් කුලී පදනම මත වාහන ලබා ගැනීමට ක්‍රියා කල බවත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආයතනය තුල අනුගමනය නොකල බවද, තමා පත්වීමෙන් පසුවද පෙර පැවති ක්‍රමවේදයම අනුගමනය කල බවද පවසයි. වාහනයක් අවශ්‍ය බවට ඉංජිනේරු සංස්ථාවට අයත් යම් අංශයක් මගින් කරනු ලබන ඉල්ලීමක් වේ නම් ඒ සම්බන්ධව අනුමැතිය ලබාදී ප්‍රවාහන කළමනාකරු වෙත යොමු කරන බවද, ගොනු හා ගිවිසුම් සකස් කර එවීමෙන් පසු අදාල ගිවිසුම් අත්සන් කර ප්‍රවාහන කළමනාකරු වෙත ගොනුව යොමු කරන බවද, පවසයි. ගිවිසුම් අනුව ඉන්ධන හා රියදුරකු ලබාදීම ඉංජිනේරු සංස්ථාව මගින් සිදු කරන බවද පවසයි ඉදිකිරීම් අමාත්‍යාංශය වෙතද මෙසේ තමා පැමිණීමට පෙර සිටම වාහන ලබාදී තිබූ බවත්, ඒ අනුව මෙම ක්‍රියා දාමයද තමන් අනුගමනය කල බවද පවසයි. තමා රාජකාරී කල කාලය තුල ආයු මාරසිංහ හා ජගත් පෙරේරා යන අයවලුන් සභාපති ලෙස කටයුතු කල බවත්, ලසන්ත අලගියවන්න නියෝජ්‍ය අමාත්‍යවරයා කල ඉල්ලීමක් හැරෙන්නට අමාත්‍ය වරයා එවැනි ලිඛිත ඉල්ලීමක් නොකල බවද පවසා සිටින අතර, සභාපතිවරුද එලෙස උපදෙස් දුන් බවක් මතක නැති බව පවසා ඇත. මෙලෙස වාහන පවරාගෙන ලබාදීම සභාපති වරයාගේ අනුදැනුම මත වාචික උපදෙස් අනුව සිදුකල බවත්, ඒ සදහා කිසිදු අවස්ථාවකවත් ලිඛිත නියෝග ලබාදී නොමැති බවත් පවසා සිටින අතර, ගිණුම් කටයුතු පහසු කර ගැනීම සදහා පසුව වැඩබිම් වලින් ලිපි ලබාගෙන ගොනුගත කරන ලද බවද පවසා සිටියි. මෙසේ අමාත්‍යාංශයට මෙන්ම අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය සදහාද වාහන කුලී පදනම මත ලබාදී ඇති බවද ප්‍රකාශ කරයි.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් කුලී පදනම මත පවරා ගත් වාහන අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත ලබා ගනිමින් එම වාහන ජනසෙවන ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු සදහා යොදවා ගන්නා බවට හුවා දක්වමින් මෙම වාහන අමාත්‍ය කාර්යාලය වෙත ලබාගෙන ඇති බවත්, එලෙස ලබා ගන්නා ලද වාහන එම ව්‍යාපෘතියේ රාජකාරීමය කටයුතු සදහා යොදවා නොගනිමින් එම වාහන සදහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රුපියල් 91,635,591.03 ක මූල්‍යමය පාඩුවක් සිදු කිරීම සදහා ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය වරයා වශයෙන් කටයුතු කල විමල් වීරවංශ මහතා විසින් කටයුතු කර ඇති බවටත් එම කටයුත්ත සදහා ඔහු විසින් ආධාර අනුබල ලබාදීම සිදුකර ඇති බවටත්, ඔහු සමග අත් අඩංගුවට ගන්නා ලද ඉදිකිරීම් ඉංජිනේරු සංස්ථාවේ හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පාලන සහ මෙහෙයුම් මෙම කටයුත්ත සදහා සෘජුව ආධාර අනුබල දීම් සිදුකර ඇති බවටත් විමර්ශන තුලින් අනාවරණය විය.

ඉහත චෝදනා යටතේ අත් අඩංගුවට ගන්නා ලද හිටපු අමාත්‍ය විමල් වීරවංශ මහතාගෙන් සහ ඉංජිනේරු සංස්ථාවේ හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සමන්ත ලොකුහැන්නදිගේ මහතාගෙන් අත් අඩංගුවට ගැනීම සදහා හේතුපාදක වූ චෝදනා සම්බන්ධයෙන් පහදා දී ඊට අදාලව එම දෙදෙනාගේ ප්‍රකාශයන් ලබා ගැනීමට කටයුතු කල අතර, මෙම ප්‍රකාශයන් තුලින් මෙම දෙදෙනාව අත් අඩංගුවට ගැනීමට අදාල වූ චෝදනා සම්බන්ධයෙන් ඔවුන්ගේ නිවැරදි භාවය ඔප්පු කිරීම සදහා පැහැදිලි තොරතුරු සනාථ කිරීමට අපොහොසත් විය.

ඉහත විමර්ශනයට අදාලව අනාවරණය වූ කරුණු මත ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය වරයා වශයෙන් 2010 අග සිට 2015 ජනවාරි දක්වා කටයුතු කර ඇති විමල් වීරවංශ

මහතා විසින් 2011 වර්ෂයේ ජනවාරි සිට 2014 වර්ෂයේ දෙසැම්බර් අතර කාලය තුළ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් කුලී පදනම මත ලබාගත් වාහන 57 කට ආසන්න සංඛ්‍යාවක් අමාත්‍ය කාර්යාලය වෙත ලබා ගනිමින් එම වාහන අමාත්‍ය කාර්යාලයේ පරිබාහිර පුද්ගලයින් වන ඔහුගේ ලගම ඥාතීන් වෙත, තම පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයන් වෙතට, අමාත්‍ය කාර්ය මණ්ඩලයට නොගැනෙන වෙනත් පරිබාහිර පුද්ගලයින් වෙත හා ලගම හිතවතුන් වෙත ලබාදීම තුලින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතට එම වාහන වෙනුවෙන් ඉන්ධන පිරිවැය වශයෙන් රුපියල් 58,152,133.72 ක මුදලක්ද, වාහන කුලිය වශයෙන් රුපියල් 33,483,457.31 ක මුදලක්ද වශයෙන් රුපියල් 91,635,591.03 ක මුළු පාඩුවක් දැරීමට සැලැස්වීමෙන්ද,

ඔහු විසින් ජාතික නිදහස් පෙරමුණේ පක්ෂ ක්‍රියාකාරී සාමාජිකයන් 03 දෙනෙකු වන ප්‍රියන්ත් විතාරණ, සමන්සිරි හේරත්, පී.එස්. විජේසිරි යන පක්ෂ සාමාජිකයන් වෙත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සගතුරන් කොදරමින් ප්‍රියන්ත් විතාරණ මහතා වෙත රුපියල් 1,465,894.62 ක මුදලක වටිනාකමකින් යුත් ඉන්ධන ලබා ගැනීමට සැලැස්වීමෙන්ද, සමන්සිරි හේරත් මහතා වෙත රුපියල් 189,353.31 ක වටිනාකමකින් යුත් ඉන්ධන ලබා ගැනීමට සැලැස්වීමෙන්ද, පී.එස්. විජේසිරි මහතා වෙත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සතු අංක 61-5125 දරණ වාහනය ලබා දීමට සලස්වා ඒ සඳහා රුපියල් 769,360.39 ක වටිනාකමකින් යුත් ඉන්ධන ලබා දීමට සැලැස්වීමෙන්ද,

ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය වරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී තම පෞද්ගලික කාර්ය මණ්ඩලයේ මාධ්‍ය ලේකම් වරයෙකු වශයෙන් කටයුතු කල ප්‍රසාද් මංජු මහතා වෙත තම නිල කටයුතු සඳහා හිමි වාහනයට අදාලව 2011 පෙබරවාරි මස සිට 2014 නොවැම්බර් මස දක්වා ඉන්ධන දීමනාව වශයෙන් රුපියල් 1,526,369.30 ක මුදලක්ද, ප්‍රවාහන දීමනාව වශයෙන් රුපියල් 1,655,599.08 ක මුදලක්ද ලබා ගනිමින් සිටියදී ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා අමාත්‍ය කාර්යාලය වෙත ලබාගත් වාහනයක් ඔහු වෙත ලබා දෙමින් ඒ සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත වාහන කුලිය සහ ඉන්ධන ලබා දීම වෙනුවෙන් රුපියල් 1,746,000.00 ක පිරිවැයක් දැරීමට සැලැස්වීමෙන්ද,

අමාත්‍ය වරයෙක් වශයෙන් කටයුතු කරමින් සිටියදී තම පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සම්බන්ධීකරණ ලේකම් වරයා වශයෙන් කටයුතු කල ඩබ්.එම්.කේ.පී.එස්. විජේසේකර මහතා වෙත තම නිල කටයුතු සඳහා හිමි වාහනයට අදාලව ප්‍රවාහන දීමනාව වශයෙන් රුපියල් 1,247,419.35 ක මුදලක්ද, ඉන්ධන දීමනාව වශයෙන් රුපියල් 1,700,415.16 ක මුදලක්ද, ලබා ගනිමින් සිටියදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත ලබාගත් වාහන අතරින් එක් වාහනයක් ඔහු වෙත ලබා දෙමින් ඒ සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත වාහන කුලිය සහ ඉන්ධන ලබා දීම වෙනුවෙන් රුපියල් 1,158,728.84 ක පිරිවැයක් දැරීමට සැලැස්වීමෙන්ද,

යන චෝදනා වලට අදාලව ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය වරයා වශයෙන් කටයුතු කල නො. 74 J, මංගල මාවත, හෝකන්දර දකුණ, හෝකන්දර ලිපිනයේ පදිංචි විමල් වීරවංශ යන අය වෙත විශ්වාසය කඩ කිරීම, වංචා කිරීම යන චෝදනා සඳහාද සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීම යන චෝදනා සම්බන්ධයෙන් ආධාර අනුබල දීම සම්බන්ධයෙන්ද 1999 අංක 28 දරන පනතින් සංශෝධිත වූ 1982 අංක 12 දරන පොදු දේපල විෂයෙහි ගැනෙන වැරදි පිළිබඳ පනතේ වගන්ති 5 (1) සමග කියවෙන ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 100, 102, 113, 388, 389, 400 වගන්ති යටතේ සහ 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණ පනතේ වගන්ති 3 (ආ), (2) අනුව වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් කරුණු අනාවරණය වී ඇති හෙයින් ඉහත චෝදනා මත එම චෝදනාවන් කියවා දී ඒකක 07 හි ස්ථානාධිපති ප්‍ර.පො.ප. ප්‍රේමරත්න වන මා විසින් පැය 10.10 ට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ ඒකක අංක 07 තුලදී අත් අඩංගුවට ගෙන ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

තවද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මහව කම්හේ හා පාලන ඔහුගේ අභිමතය පරිදි කුලී පදනම මත ලබා ගන්නා ලද වාහන අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සාමාන්‍යාධිකාරී වරයාගේ හෝ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් විධිමත්ව ලබා ගන්නා ලද අවසරයකින් තොරව අමාත්‍ය කාර්යාලය වෙත වාහන 57 කට ආසන්න සංඛ්‍යාවක් ලබාදීම තුලින් ඒ සඳහා ඉන්ධන දීමනාවක් වශයෙන් රුපියල් 33,483,457.31 ක මුදලක්ද, කුලී දීමනාව වශයෙන් රුපියල් 58,152,133.72 ක මුදලක්ද, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත දැරීමට සැලැස්වීමෙන්ද, වාහන 03 ක් සඳහා ඉන්ධන පිරිවැය වශයෙන් රුපියල් 2,424,608.22 ක මුදලක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත දැරීමට සැලැස්වීමෙන්ද, අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නොවන සාමාජිකයෙක් වෙත අංක 61-5125 දරණ සංස්ථා සතු වාහනය ලබා දීමට සැලැස්වීම යන චෝදනාව යටතේ නො. 66, මාරගොල්ලිය, කෑගල්ල ලිපිනයේ පදිංචි සමන්ත ප්‍රියන්ත් ලොකුහැන්නදිගේ යන අයවලුන් අද දින විශ්වාසය කඩ කිරීම, වංචා කිරීම හා කූට ලේඛන සැදීම යන චෝදනා සම්බන්ධයෙන්ද එම චෝදනා සඳහා ආධාර අනුබල දීම සම්බන්ධයෙන්ද යන වරදවල් යටතේ 1999 අංක 28 දරන පනතින් සංශෝධිත වූ 1982 අංක 12 දරන පොදු දේපල විෂයෙහි ගැනෙන වැරදි පිළිබඳ පනතේ වගන්ති 5 (1) සමග කියවෙන ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 100, 102, 113, 388, 389, 400, 454, 457 යටතේ සහ 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණ පනතේ වගන්ති 03 (ආ), (2) අනුව වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් කරුණු අනාවරණය වී ඇති හෙයින් එම චෝදනාවන් කියවා දී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ ඒකක 07 හි ස්ථානාධිපති ප්‍ර.පො.ප. අනුර ප්‍රේමරත්න වන මා විසින් පැය 10.20 ට මූල්‍ය

අපරාධ විමර්ශන කොට්ඨාශයේ ඒකක අංක 07 තුළදී අත් අඩංගුවට ගෙන ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

මෙම සැකකරුවන්ට විරුද්ධව ඇති අදාල විෂය වස්තුවේ වටිනාකම රුපියල් 25,000/- ඉක්මවන බැවින්, ඒ සම්බන්ධව සහකාර පොලිස් අධිකාරී තුමාගේ වාර්තාවක් මුල් බී වාර්තාව සමග ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවවද ගෞරව පූර්වකව ගරු අධිකරණය වෙත දන්වා සිටිමි.

තවද ඉහත පැමිණිල්ලේ සඳහන් කරුණු අනුව මෙම පැමිණිල්ල තුල රජයේ මුදල් සාපරාධී සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම, වංචා කිරීම යන චෝදනා සම්බන්ධයෙන්ද, ඒ සම්බන්ධයෙන් ආධාර අනුබල දීම යන වරදවල් යටතේද, 1999 අංක 28 දරණ පනතින් සංශෝධිත 1982 අංක 12 දරණ පොදු දේපල විෂයේලා ගැසෙන වැරදි පිළිබඳ පනතේ වගන්ති 5 (1) සමග කියවෙන ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 100, 102, 113, 388, 389, 400 යටතේ සහ 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණ පනතේ වගන්ති 03 (ආ), (2) අනුව වැරදි සිදුකර ඇති බවට ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කරමින් මෙම සැකකරුවන්ට විරුද්ධව විමර්ශන කටයුතු මෙතෙක් අවසන් කර නොමැති බැවින්, ඉදිරිපත් කරන සැකකරුවන් 2017.01.24 දින දක්වා දින 14 ක් රක්ෂිත බන්ධනාගාර ගත කරන මෙන් ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

මේ අනුව මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩිදුරටත් විමර්ශන කටයුතු සිදු කරමින් පවතින අතර, මෙතෙක් සිදු කරන ලද විමර්ශන තුලින් අනාවරණය වූ කරුණු අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 102, 386 වන වගන්ති සමග කියවිය යුතු සංශෝධිත 1982 අංක 12 දරණ පොදු දේපල විෂයේලා කරන ලබන වැරදි පිළිබඳ පනතේ 5 (1) වගන්තිය යටතේ හා ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 102, 113 (ආ), 386, 389, 400, 402, 454 හා මුදල් විශුද්ධිකරණ පනතේ 03 වගන්තියට හෝ ගැසෙන වරදක් සිදුකර ඇති බවට විමර්ශන තුලින් අනාවරණය වන අතර, කරුණු තහවුරු කර ගැනීම සඳහා තව දුරටත් විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.

2017.01.10

ස්ථානාධිපති,
ඒකක 07,
මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය

<u>සැකකරුවන්</u>

01. විමල් වීරවංශ,
    නො. 74 J,
    මංගල මාවත,
    හෝකන්දර දකුණ,
    හෝකන්දර.

02. සමන්ත ප්‍රියනාත් ලොකුහැන්නදිගේ
    නො. 66,
    මාරකොල්ලිය,
    තංගල්ල.